# 10 වන ශ්‍රේණිය - 01 වන පාඩම
# දිවැස් වැකි හා කිතු උපත

## ◈ දිවැසිවරුන් මගින් ඉටු වූ කාර්යභාරය

- දිවැසිවරයකු යනු දේව කැඳවීම තුළ උන්වහන්සේ එළිදරව් කරන ලද පණිවුඩ වෙනසක් නොකර ජනතාවට පිළිගැන්වූ තැනැත්තාය. ඒ අනුව ඔහුගේ මූලික කාර්යභාර්ය දේව පණිවුඩ ඒ ආකාරයෙන්ම ජනතාවට දැන්වීමටය.

- මේ තුළින් බලාපොරොත්තු වූයේ, දෙවිඳුන්ගෙන් ඈත් වූ පව්ටු ජීවන රටාවකට යොමු ජනතාව නැවත උන්වහන්සේ වෙත හැරීමයි. එහිදී ඊට පාදක වූ හේතු සොයා බලා ඉන් මිදීමේ මඟ පෙන්වාදීම ද දිවැසිවරයා සතු කාර්යභාරයකි.

- දිවැසිවරයා නිරන්තරයෙන්ම දෙවිඳුන් වෙනුවෙන් පෙනී සිටිය යුතුය. උන්වහන්ගේ කැමැත්ත ඉටු කළ යුතුය.

- තම සේවය නිසා එල්ල විය හැකි අභියෝග වලට මුහුණදීමට හැකියාව තිබිය යුතුය. දෙවිඳුන් කෙරෙහි පූර්ණ විශ්වාසයෙන් කටයුතු කළ යුතුය.

## ◈ දිවැසිවැකි මගින් පල වූ යේසු උපතේ සුවිශේෂිතාවය

- යේසුස් වහන්සේගේ උපත අහඹු සිදුවීමක් නොවේ. එසේ කිව හැකි වන්නේ උන්වහන්සේගේ උපත සියවස් 06 කට පෙර විසූ දිවැසිවරුන් වන යෙසායා හා මීකා වැන්නවුන් උන්වහන්සේගේ උපත පිළිබඳ කළ දිවැස්වැකි උන්වහන්සේගේ උපත තුළ ඒ ආකාරයෙන්ම ඉෂ්ට වීමයි. එම දිවැස්වැකි මෙසේය.

    - යේසුස් වහන්සේ කන්‍යාවක් තුළින් බිහිවීම.
    - "එම්මානුවෙල්" යන නාමය තැබීම.
    - දාවිත්ගේ පරපුරෙන් පැමිණීම.
    - අන්ධකාරයේ සිටින සෙනඟ ආලෝකය අත්දැකීම.
    - ධර්මිෂ්ඨකමින් රජකම් කිරීම.
    - බෙත්ලෙහෙම් නම් කුඩා ගමේ යුදා ගෝත්‍රයේ ඉපදීම.
    - එතුමාගේ පෙළපත ඈත අතීතය දක්වා දිවයාම.

## ◈ උන්වහන්සේගේ මෙහෙවර පිළිබඳ දිවැස්වැකි

- යේසුස් වහන්සේ රජෙකු මෙන් ක්‍රියාකරන බව. එනම්, දේශපාලන රජෙකු නොව ආත්මික රජෙකු ලෙසය.
- එතුමන් යහපත් උපදේශකයෙක් ලෙස ක්‍රියාකරන බව.
- බලවත් ලෙස දෙවි තුමෙකි මෙන් ක්‍රියා කරන බව.
- මිනිසුන් අතර හා දේව සබඳතාවය ගොඩනඟන සාමයේ කුමරු ලෙස ක්‍රියා කරන බව.
- අසාධාරණයට ලක්වූවන් ඉන් මුදන බව.
- අන්ධකාරයේ යහපත නොදැන සිටි ජනතාවට ආලෝකයේ මාර්ගය පෙන්වා දෙන බව.
- ඉහත සඳහන් කළ සියලු කාරණා උන්වහන්සේගේ මිහිමත මෙහෙවර කළ සමය තුළ උන්වහන්සේ ඉටු කළ සේක.

# 10 වන ශ්‍රේණිය - 02 වන පාඩම
# විශිෂ්ට වූ සේවකත්වය

- යේසුස් වහන්සේගේ සමයේ පලස්තීනය (ඉශ්‍රායෙලය) රෝම අධිරාජ්‍යයට යටත්ව පැවති අතර, ඔවුන් ගෙන ගිය කෲර පාලනයට එරෙහිව විවිධ සමාජ කණ්ඩායම් මර්දනය කිරීමට රෝම පාලනය දැඩි පියවරු ගත්හ. මෙම ගැටුම් වලට මැදි වූ අහිංසක ජනතාව දැඩි පීඩනයට පත්ව සිටියහ.

- ඔවුන් නිරතුරුවම බලා සිටියේ තම දේශයට සාමය හා විමුක්තිය උදාවන තෙක්ය. ඔවුන් සිතුවේ මෙම පීඩා වලින් ඔවුන් මුදවාලීමට ''මෙසියස් වහන්සේ'' (ගැළවුම්කරුවාණන්) ලොව පහළවනු ඇතැයි කියාය.

- ඔවුන් අපේක්ෂා කළ මෙසියස් (හෙබ්‍රෙව්) / ක්‍රිස්ටෝස් (ග්‍රීක) හෙවත් ආලේප ලත් තැනැත්තාගේ පැමිණීම යේසු උපත මඟින් සම්පූර්ණ විය.

- මේ පිළිබඳව පළමු දිවැස් වැනි යේසු උපත මඟින් සනාථ විය.

- ස්නාවක යොහාන්තුමාගේ සේවය පිළිබඳ යෙසායා හා මලාකි යන දිවැසිවරු දිවැස්වැකි පවසා ඇති' එනම්, මලාකි දිවැසිවරයා,

    - උන්වහන්සේට පෙරටුව යන බව
    - දේව මාලිගාවට වඩිනා බව.
    - සෙනඟ පුන පුනා බලා සිටින දේව දූතයා පැමිණ එතුමන්ගේ ගිවිසුම ප්‍රකාශ කරන බව පැවසීය.

- යෙසායා දිවැසිවරයා,

    - වනන්තරය සමිඳුන්ට මාවතක් එළි කරන බව.
    - සියලු මිටියාවන් පරවනු ලබන බව.
    - කඳු හෙල් කපා පහත් කරන බව.
    - සියලු හෙල් සමතලා කරන බව.
    - රළු තැන් සුමුදු කරන බව ද පැවසීය.

- යේසුස් වහන්සේගේ සේවය ගැන යෙසායාතුමා පැවසුවේ,

    - යුක්තිය හා ධර්මිෂ්ඨකම ඉටුකරන බව.
    - අපේ දුක් පීඩා උසුලන බව.
    - අප විඳිය යුතු දඬුවම වෙනුවට සාමය ලබාදෙන බව.
    - දේව ආත්මය උන්වහන්සේ සමඟ ඇති බව.
    - දිළිඳුන්ට සුභාරංචියද, අන්ධයන්ට පෙනීම ද, වහලුන්ට මිදීම ද දෙන බව.

# 10 වන ශ්‍රේණිය - 03 වන පාඩම
# දේව සැලැස්මට අවනත වූවෝ

- ජේසුතුමා ලොව පහළ වන උතුම් මෙහෙවර ඉෂ්ට කිරීමේ දේව සැලැස්ම දියත් කිරීමේදී උන්වහන්සේගේ හඬට යහපත් ප්‍රතිචාර දක්වමින් කීකරු වූවෝ කිහිපදෙනෙකි.

## ◈ ගාබ්‍රියෙල් දේවදූතයා

- ගාබ්‍රියෙල් නිරන්තරයෙන් දේව පණිවිඩය රැගෙන එමින් දේව සැලැස්ම එළිදරව් කළේය. සෙකරියස්තුමා වෙත ගාබ්‍රියෙල් දේවදූතයා යොහාන්තුමාගේ උපත පිළිබඳ සියලු පුවත් දැන්වූයේය. එලෙසම යේසු උපතේදී මරියතුමියට සුපුවත දැන්වීම, ජුසේතුමාය මඟපෙන්වීම, ශාස්ත්‍රවන්තයන්ට හෙරෝද් රජ මඟහැර යාමට කීම, මිසරයට යාමට හා නැවත ඒමට දැන්වීම ආදී අවස්ථාවල මැදිහත්කරුවෙකු ලෙස දේව සැලැස්මය අනුව ක්‍රියා කළේය.

## ◈ සෙකරියස්තුමා

- පුත්‍රයෙකු ලබාදෙන මෙන් යාච්ඤා කළ ද, දේව දූතයා පණිවුඩය සෙකරියස්තුමාට අදහාගත නොහැකිවිය. නමුත් දේවදූතයා පණිවිඩය අනුව සියලු කාරණා පිළිගෙන එතුමා ක්‍රියා කළේය. ආත්මයෙන් පූර්ණව ගීතිකා ගායනා කළ අතර, තම පුත්‍රයා තුළින් ඉටුකිරීමට යෙදෙන මෙහෙවර හොඳින් අවබෝධ කරගෙන ක්‍රියා කළේය.

## ◈ එලිසබෙත්තුමිය

- තම යැදුමට මහලු වියේදී පිළිතුරු ලෙස මෙතුමිය තම පුත්‍රයා දේව කැමැත්ත අනුව ගොඩ නැගුවාය. ගැලවුම්කරුවාණන්ගේ මව් වූ මරියා හට ගෞරවයෙන් සැලකීය. යොහාන්තුමාට නම් තබන මොහොතේ සමාජ බාධක නොතකා දේව කැමැත්ත ඉටු කිරීමට තරම් නිර්භීත විය.

## ◈ මරියතුමිය

- මරියතුමිය දේව පණිවුඩය ලද මොහොතේ කලබලයට ලත්වූ නමුත් දෙවියන්වහන්සේට සියල්ල කළ හැකිය. ඔබගේ කැමැත්ත වේවා යන යටහත් හා විශ්වාසනීය සිතුවිල්ලෙන් දෙවියන්හට භාර විය. මේ සිදුවීමත් සමඟ සමාජයේ අභියෝග අනන්ත ඈ වෙත එල්ල වන බව දැන සිටියාය. නමුත් ඒ සියල්ල සැදැහැ සිතින් කරගෙන දෙවිඳුන්ට කීකරු වූයේ ''ඔබගේ දාසිය මම වෙමි'' යන යටහත් වදන පවසමිනි.

## ◈ යෝසෙප්තුමා

- තමා විවාහ වීමට සිටි කාන්තාව ගර්භණී වූ බව දැනගත් පසු කනස්සල්ලට පත්ව ඇයට සමාජයේ අපවාදයෙන් ද නිදහස් කර ගැනීමේ අරමුණින් පලායාමට සිතුවද, දේව දූත පණිවුඩයට කීකරු වීමටත් මරියතුමිය රැකගැනීමටත් ජුසේතුමා දෙවරක් නොසිතීය. යේසු උපත සිදුවන තුරු මරියතුමිය රැක ගැනීමට එතුමා දිවිහිමියෙන් කැප වූ අතර, දරුවාට අවුරුදු 29 වන තෙක් පියෙකුගේ රැකවරණය ලබාදුනි.

# 10 වන ශ්‍රේණිය - 04 වන පාඩම
# අති විශේෂ උපත්

- ගාබ්‍රියෙල් දේවදූතයා නිතරම සුභ පණිවුඩ ගෙන ඒමේ යෙදී සිටින්නේය. යොහාන් තුමාගේ හා යේසු තුමාගේ උපතට මඟ පෙන්වනු ලැබුවේ ඔහුය. ඉන් අදහස් වන්නේ මෙම උපත් දෙකම දේව සැලැස්මට අනුව සිදු වූ බවය.

- යේසුස් වහන්සේගේ උපතට අහසේ පෑයු අමුතු තරුවද ශාස්ත්‍රවන්තයින්ට යේසු උපත දැන්වීමට මඟ පෙන්වීය. ඔවුන් ගෙන ආ රන්, තුවරලා, ගන්ධරස එතුමාගේ උපත සුවිශේෂි බව දන්වයි.

- යොහාන්තුමාගේ උපත සෙකරියස් පූජකතුමාගේ හා එලිසබෙත්තුමියගේ යැදුමට පිළිතුරකි. වයස්ගතව සිටි ඔවුන්ට දේව හාස්කමක් තුළ මෙම දරුවා ලැබිණි. සෙකරියස්තුමා ගැයූ ප්‍රශංසා ගීයෙන් විශේෂ සත්‍යභාවයන් රැසක් අපට එළිදරව් කරයි.

    - අතීතයේ දිවැසිවරු ප්‍රකාශ කළ ද දිවැස්වැකි ඉටු විය.
    - මෙම උපත් තුළින් දෙවිදාණෝ ජනතාවට විමුක්තිය සලසාදෙන සේක.
    - යේසුස් වහන්සේගේ මෙහෙවරට යොහාන්තුමා මඟ සනසන සේක.
    - යොහාන්තුමාගේ සේවය සෙනඟ පසුතැවිලි වීමට කැඳවීමයි.
    - යේසුස් වහන්සේ අදහා ගන්නා අයට පව් කමාව ලැබේ.
    - අන්ධකාරයේ සිටින අයට ආලෝකය උදා වේ.

- දේව දූතයා යේසු කුමරු ඉපදුන සුපුවත එඬේරුන්ට දැන්වූ අතර, එතුමා හඳුනා ගැනීමේ සලකුණ ලෙස කීමේ ''ගව ඔරුවක බාවා සිටින බිළිදෙක් ඔබට සම්බ වන්නේය.'' යනුවෙනි.

- දිවැස්වැකි වලට අනුව මරියතුමිය හා යෝසෙප්තුමා දාවිත්ගේ පෙළපතට අයිති වූවෝය. එලෙසම යේසු උපත බෙත්ලෙහෙමේ සිදුවීම ද දේව සැලැස්මේ කොටසකි. දිළිඳුන් වෙත සුභාරංචිය ගෙන යාමේ මෙහෙවර යේසු උපතේ සිටම සිදුවිය.

- එඬේරුන් යුදෙව් සමාජය සුළු කොට ගණන් ගනු ලැබූ පිරිසක් වුවද යේසුතුමා පළමුව නමස්කාර කළේ ඔවුන්ය.

- යේසුතුමා තම මෙහෙවර අරඹන විට පැවති යුදෙව් සමාජ පසුබිම කෙසේවීද?

# 10 වන ශ්‍රේණිය - 05 වන පාඩම
# යේසුස් වහන්සේ හා යුදෙව් චාරිත්‍ර

- යේසුස් වහන්සේගේ සමයේ යුදෙව් ආගමික මංගල්‍යය ගණනාවක් පැවතුණ අතර, ඒවා යුදෙව් ව්‍යවස්ථාව හා බද්ධව පැවතුණි. ඒවා යුදෙව් ඉතිහාසයට සම්බන්ධ වත්පිළිවෙත් විය.

- යුදෙව්වෝ මෙම පිළිවෙත් භක්තියෙන්, කැපවීමෙන් හා වැයවීමෙන් ගෞරවාන්විතව කීකරුව ඉටුකළ අතර, එය සමාජය තුළ යුදෙව් අනන්‍යතාවය රැක ගැනීමට උදව් විය.

- මරියතුමිය හා ජුසේතුමා ද මෙම පිළිවෙත් තම පුත්‍රයා සම්බන්ධව ඉටු කළහ.

## ◈ චර්මඡේදන පිළිවෙත

- මෙම පිළිවෙත දෙවියන් විසින් ආබ්‍රහම්ට දුන් නියමයකි. මෙම පිළිවෙත ඉටුකිරීමේ දී අරමුණ යුදෙව් ජනතාව දෙවියන් වීමේ තත්ත්වයට ඇතුළුවීමයි. මෙම පිළිවෙත බාහිරව ශරීරයේ දැරුවද සමාජය තුළ ''යුදෙව් අනන්‍යතාවය'' තහවුරු විය.

- යුදෙව් පිරිමි දරුවෙකු ඉපදී දින 08 කට පසුව මෙම පිළිවෙත ඉටුකරන අතර, ගාබ්‍රියෙල් දේව දූතයා විසින් ලබාදුන් යේසුස් යන නම එදින ලබාදෙන ලදි. එහි අර්ථය දෙවියන්වහන්සේ මුදන සේක යන්නයි.

## ◈ කුළුඳුලන් කැපකිරීම හා මුදවා ගැනීම

- මෙම පිළිවෙත නික්මයාම සිද්ධිය හා බැඳි පවතී. මිසරයේ අවුරුදු 400 වහල්කමේ සිටි යුදෙව් ජනතාව මොසෙස් තුමාගේ නායකත්වය යටතේ ඉන් නිදහස් වන දින මිසරයේ සෑම පවුලකම කුළුඳුල් පිරිමි දරුවා මියගිය අතර, යුදෙව් දරුවෝ ආරක්ෂා කරනු ලැබීය. මෙම සිදුවීම සිහිකරනු පිණිස කුළුඳුල් පිරිමි දරුවන් ඉපදී දින 40 කට පසු දේව මාළිගාවේ දී කැප කරනු ලබයි. එහි පරවියන් දෙදෙනෙකු හෝ කොබෙයියන් දෙදෙනෙකු පූජා කිරීමට නියමිත වූ අතර, ධනවත් අය බැටළුවකු පූජා කරයි.
- කිතුනුවන් ලෙස අපටද, විවිධ වත්පිළිවෙත් කිතුනු දිවිය තුළ ඉටු කිරීමට සිදුවේ.
    - බෞතීස්මය
    - කැප කිරීම
    - ශුද්ධ සහභාගීකම

- ඊට අමතරව ලාංකීය ජනතාව ලෙස සංස්කෘතික උත්සව හා සිරිත් විරිත් වලට කිතුනුවන්ට දායකවීමට සිදුවනු ඇත.
    - සිංහල හා හින්දු අලුත් අවුරුද්ද
    - අකුරු කියවීම
    - නම් තැබීම
    - ගෙට ගෙවැදීම
    - ගැහැණු දරුවන් වැඩිවියට පැමිණීමේ උත්සව
    - බෝවන රෝග හා සම්බන්ධ විරිත්
- මෙම චාරිත්‍ර හා වත්පිළිවෙත් තුළදී කිතුණු ඇදහිල්ලට පටහැනි නොවන පරිදි කල්පනාකාරීව දායකවීමෙන් දෙවියන් හට පමණක් මුල් තැන දීමත් ඉතා වැදගත්ය.

- යේසුස් වහන්සේට කැප කිරීමට දේව මාළිගාවට ගෙන ගිය මොහොතේ විශේෂ පුද්ගලයන් දෙදෙනෙකු උන්වහන්සේ ගැන අනාවැකි පැවසූහ.
    - සිමියොන්
    - ආනා

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය

## ◈ සිමියොන්

- මෙම නමෙහි අර්ථය දෙවියන්වහන්සේ ඇසූ සේක යනුය.

- මෙතුමා දැහැමි පුද්ගලයෙකු වන අතර, ශුද්ධාත්මයාණන් තුළ ක්‍රියා කළ අයෙකි.

- ඔහු මරණයට පෙර මෙසියස් වහන්සේ දකින බවට අනාවරණයක් ලබා තිබූ අතර, යේසුස් වහන්සේ දුටු පසු උන්වහන්සේ ගැන අනාවැකි කීවේය.

    - යේසුස් නම් මෙසියස් වහන්සේය.
    - උන්වහන්සේ යුදෙව් හා විජාතීන්ට ගැලවීම දෙන සේක.
    - උන්වහන්සේ පිළිනොගන්නා අය වැටීමට ලක් වේ.
    - කුරුස පූජාව නිසා මරියතුමිය දුක් විඳීමට යන බව.

## ◈ ආනා දිවැසිවරිය

- මෙතුමිය දේව මාලිගාවේ සිට නිරන්තරයෙන් යාච්ඤාවේ යෙදී සිටි අතර, උපවාසයේ යෙදෙමින් භක්තිවන්ත දිවියක් ගත කළාය. ඇයද යේසුස් වහන්සේ මෙසියන්වහන්සේ ප්‍රකාශ කළ අතර, එතුමා යුදෙව්වන්ට මෙන්ම විජාතීන්ටද විමුක්තිය දෙව බවට දිවැස් වැකි කීවාය. මොහුගේ පියා ෂානුවෙල්ය.

- මෙසියස් යන නමෙහි අර්ථය ආලේපලත් තැනැත්තා යනුය.

- හෙබ්‍රෙව් - මෙසියස් } ආලේපලත් තැනැත්තා
- ග්‍රීක් - ක්‍රිස්ටෝස් }

## ◈ පාස්කු මංගල්‍යය

- සෑම යුදෙව්වකුම අඩුම තරමින් වසරකට 03 වතාවක් හෝ දේව මාලිගාවට යා යුතුය.

- යුදෙව් පාස්කු මංගල්‍යය යනු, දෙවියන් ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් මුදවා ගෙන මෝසෙස්ගේ නායකත්වයෙන් කානාන් දේශයට ගෙන ගිය සිද්ධිය සිහිකරන මංගල්‍යයයි.

- යේසුස් වහන්සේද දෙමාපියන් සමග පාස්කු මංගල්‍යය සැමරීමට අවුරුදු 12 දී සහභාගී වූ බව බයිබලයේ සඳහන්ව ඇත.

- එහිදී එතුමා දේව මාලිගාවේ නතර වීම ගැන මරියතුමිය ඇසූ විට දුන් පිළිතුර වූයේ, ''ඔබ මා සෙව්වේ මන්ද? මා පියාණන් මැදුරෙහි සිටිය යුතු බව ඔබ නොදන්නෙහිද?'' (ශු.ලූක් 2:49) යනුවෙනි.

- මෙම වදනින් හෙළිවන සත්‍යතාවයන්

    - යේසුස් වහන්සේ, දෙවියන් තම පියාණන් ලෙස පිළිගත් බව.
    - කුඩා කළ සිට යේසුස් වහන්සේ උන්වහන්සේගේ මෙහෙවර අවබෝධ කරගෙන සිටි බව.

- කුඩා කළ සිටම යේසුස් වහන්සේගේ ප්‍රඥා මහිමයෙන්ද, කාය ශක්තියෙන්ද මිනිසුන්ගේ ප්‍රසාදය ලබමින්ද වැඩුණු සේක. (ශු.ලූක් 2:52)

# 10 වන ශ්‍රේණිය - 06 වන පාඩම
# පෙරමඟ දූත සේවය

## ❖ ස්නාවක යොහාන්තුමා

- ස්නාවක යොහාන්තුමාගේ මව එලිසබෙත් තුමිය වන අතර, පියා සෙකරියස් පූජකතුමාය.
- එලිසබෙත් තුමිය සහ සෙකරියස් පූජකතුමා ඉතා වයස්ගතව සිටියදී දෙවියන්වහන්සේ විසින් ඔවුන්ට ඇදහිය නොහැකි අන්දමේ පොරොන්දුවක් ලබාදුන් සේක. එම පොරොන්දුව නම් ඔවුන් දෙදෙනාට දරුවෙකු ලබාදෙන බවය.
- එහෙත් එලිසබෙත් තුමිය ඉතා වයස්ගතව සිටිය බැවින් සෙකරියස් පූජකතුමා එය අවිශ්වාස කළේය.
- මෙම විස්මයජනක පුවත සෙකරියස් පූජකතුමාට ගෙන ආවේ ගාබ්‍රියෙල් දේව දූතයාය.
- දේව පණිවිඩය අවිශ්වාස කළ සෙකරියස් පූජකතුමා හට දරුවා ලැබෙන තුරු ගොළු වී සිටීමට සිදුවිය.
- ස්නාවක යොහාන්තුමා මෙලොව එළිය දැක දින 08 කට පසු චර්මඡේදනය සඳහා රැගෙන ගියේය. එහිදී දරුවාට නම තැබීමේදී ගැටළුවක් මතුවිය.
- එය නම්, එම කාලයේදී දරුවාට නම තැබිය හැක්කේ තම පියාට පමණය. එහෙත් සෙකරියස් පූජකතුමා ගොළු වී සිටි නිසා ඔහුගේ භාර්යාව වන එලිසබෙත් තුමිය දරුවාට යොහාන් යන නාමය තබන ලෙස පැවසීය.
- එම ස්ථානයේ ප්‍රධානීන් හා එලිසබෙත් තුමිය අතර සුළු වාදයක් විය.
- සෙකරියස් පූජකතුමා ලියන ලෑල්ලක් ගෙන තම දරුවාගේ නම යොහාන් ලෙස ලිව්වේය. එම ස්ථානයේ සිටි සියල්ලෝම මවිත වූහ. එකෙණෙහිම සෙකරියස් පූජකතුමා මුඛය හැර දෙවිඳුන්ට ප්‍රශංසා කළේය.
- යොහාන් යන නමෙහි අරුත වනුයේ, ''දෙවියන්වහන්සේගේ ත්‍යාගය'' යන්නයි.
- යේසුස් වහන්සේ ඉපදීමට අවුරුදු 500 කට පෙර යෙසායා අනාගතවක්තෘවරයා  ලියා තිබෙන අන්දමට යොහාන් බෞතීස්ත පැමිණියේය.
- එතුමා පැමිණියේ, අලෝකයවන් යේසුස් වහන්සේ ගැන සාක්ෂි දැරීමටය.
- යේසුස් වහන්සේ ඉපදීමට අවුරුදු 500 කට යෙසායා දිව්‍යසිවරයා පැවසූ පරිදි ස්නාවක යොහාන්තුමා ඔටුරෝම වස්ත්‍රයක් ඇඳ වනයේ සැරිසරමින් වන මී හා පළගැටියෝ ආහාරයට ගත්තේය.
- යුදයේද, යෙරුසලමේද, යෝර්දානයේද මුළු සෙනඟ මෙතුමාට පාපොච්චාරණය කරමින් බෞතීස්ම ස්නාපනය ලැබූහ.
- මෙතුමා පුදා ප්‍රාන්තයට අයත් මළ මුහුදේ වයඹ දෙස වෙරළාසන්නව ඇති කඳුකර වියළි ජනහීන ප්‍රදේශයක දේශනා කර ඇත.
- ස්නාවක යොහාන්තුමා ඇඳි වස්ත්‍ර දිව්‍යසිවර එලියාගේ වස්ත්‍ර වලට සමාන විය.
- ඔහුගේ කටුක ආහාර, චාම් දිවි පෙවෙත නැසිරයිට් නම් ජුදෙව් තපස්වරයෙකුගේ විලසට සමානය.
- යොහාන්තුමා ජනතාව බෞතීස්ම කළේ පලස්තීන්යේ ප්‍රධාන ගංගාවේය. එය යෝර්දාන් ගඟයි.

- යොහාන්තුමාව විවිධ නම් වලින් හඳුන්වනු ලබයි. ඒවානම්, පෙරමඟ දූතයා, මෙහෙසුරු දිව්‍යසිවරයා, පාළුකරයේ මොරගසන හඬ, ස්නාවක යොහාන්, යොහාන් බෞතීස්ත ය.

- යොහාන්තුමා ඉතා නිර්භීත ලෙස ජනතාවගේ වරද පෙන්වා දෙමින් මනස්ථාපනයට ගෙනාවේය.

- ''පොළොං වංශය පැමිණෙන උදහසින් පලා යන්ට නුඹලාට අවවාද කළේ කවුද?'' මෙයින් එතුමා අදහස් කරනුයේ කපටි සහ වංචනික මනුෂ්‍යයන්ට පසුතැවී සිත් හරවා නොගන්නා වූ දෙවියන්වහන්සේ පමුණුවන විනිශ්චය ගැනය.

- මෙතුමා නිරන්තරයෙන්ම ජනතාවගේ සිත් කළඹවා සැබෑ මනස්ථාපනයකට ගෙන ඒමට ඉතාමත් උත්සුක විය.

- මෙතුමා තුළ ඉතා නිහතමානී ගතිගුණාංගයන් ඇත. එනම්, ජනතාව මෙතුමා ගැන ක්‍රිස්තුස්වරයාණෝ දැයි පවසන විට එම ගෞරවය තමාට නොගෙන එන පිණිස ''මම වනාහි නුඹලාව වතුරෙන් බෞතීස්ම කරමි. නමුත් මට පසුව එන තැනැත්තේ මට වඩා බලවත්ය. මම උන්වහන්ගේ වහන් ගෙන යන්ටවත් නොවටිමි. උන්වහන්සේ නුඹලාව ශුද්ධාත්මයාණන්ගෙන්ද, ගින්නෙන්ද බෞතීස්ම කරන සේක.'' මේ අයුරින් පැවසුවේය.

- මෙතුමා නිහතමානී මෙන්ම නිර්භීත චරිතයක් විය. මෙතුමා නිරන්තරයෙන් ජනතාවට ප්‍රකාශ කළ සිටියේ, ''ඔබට අඳින ඇඳුම් දෙකක් ඇත්නම් නැති අයට එකක් දෙන්න. කෑම ඇති අය නැති අයට දෙන්න.'' යනුවෙනි.

- ස්නාවක යොහාන්තුමා සේවය කරන අතරතුරදී මහා ඛේදවාචකයක් සිදුවිය. එය නම් එතුමාගේ මරණයයි.

- ස්නාවක යොහාන්තුමා සේවය කරන අතරතුරදී මහා ඛේදවාචකයක් සිදුවිය. එය නම් එතුමාගේ මරණයයි.

- එය සිදු වූ ආකාරය හා එයට හේතුව නම් හෙරෝද් රජු තම සොහොයුරු පිලිප්ගේ භාරයාව වන හෙරෝදියස් නිසා යොහාන්තුමාව අල්ලා බැඳ හිර අඩස්සි කර තිබුණාය.

- හෙරෝද් රජතුමා මෙසේ කළේ යොහාන්තුමා හෙරෝදියස්ව ළඟ තබා ගැනීමට නුසුදුසු බව පැවසූ නිසාය.

- හොරෝද් රජුට යොහාන්තුමා මැරීමට හැඟුණ නමුත් ජනතාව යොහාන්තුමාව දිව්‍යසිවරයෙකු ලෙස සැලකූ නිසා බියට පත්විය.

- එහෙත් එක් දිනක හෙරෝද් රජුගේ උපන්දිනය දවසේ හෙරෝදියස්ගේ දියණිය වන සලෝම් පැමිණ පිරිස මැද අලංකාර නර්තනයක් ඉදිරිපත් කර හෙරෝද් රජුගේ මනපින වූවාය.

- එහෙයෙන් හෙරෝද් රජු ඇය ඉල්ලන කවර නමුත් ලබාදෙන බවට ප්‍රකාශ කර දිවුරුම් දුන්නේය.

- දියණිය තම මෑණියන්ගේ උපදෙස් අනුව ස්නාවක යොහාන්තුමාගේ හිස තැටියක දමා ලබාදෙන ලෙස ඉල්ලුවාය. එය ඇසූ රජු අතිශයින් ශෝක විය.

- එහෙත් තමාගේ දිවුරුම නිසාත් තමා සමඟ සිටින අමුත්තන් නිසාත් ඔහු ඒ ඉල්ලීම ඉටු කිරීමට අණදී කෙනෙකු යවා හිර ගෙදරදී යොහාන්තුමාගේ හිස සිඳවිය.

- යොහාන්තුමාගේ හිස තැටියක ලා තම දියණියට ගෙනැවිත් දුන්නේය. ඇය එය සිය මවට ගෙනැවිත් දුන්නාය.

- යොහාන්තුමාගේ ගෝලයෝ ඇවිත් මෘත දේහය තැන්පත් කොට තැබූහ.

- ස්නාවක යොහාන්තුමාගේ මරණය ඛේදනීය ලෙස සිදු වුවත්, මෙතුමා නිර්භීතව, නිහතමානීව යෙසායා දිව්‍යසිවරයා පැවසූ පරිදි තම සේවය නිම කළේය. මෙතුමාගේ චරිතය තුළින් අපට ගත හැකි ආදර්ශ බොහෝය.

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය

# 10 වන ශ්‍රේණිය - 07 වන පාඩම
# නාසරෙත්හි දහම් දෙසුම

- යේසුස් වහන්සේ යොහාන් බෞතීස්තුමාගෙන් බෞතීස්මය ලබා දින 40 ක් නිරාහාරව යාච්ඤා කොට ශුද්ධාත්මයෙන් පූර්ණව යක්ෂයා විසින් පරීක්ෂාවට කරනු ලදුව, ඉන් ජයගෙන ගලීලයේ නාසරෙත් නුවරට පැමිණ තම මෙහෙවර ඇරඹූ සේක.

- උන්වහන්සේගේ සේවය ''දේව රාජ්‍යය'' පදනම් කරගෙන සුබ අස්න ප්‍රකාශ කිරීමේ කාර්යය විය.

- ගලීලය නගරය අධික ජනගහනයකින් සහිත යුදෙව් හා යුදෙව් නොවන අය ජීවත් වූ වෙළඳ නගරයකි.

- උන්වහන්සේ කුඩා කාලයේ සිට නමස්කාරය සඳහා ගියේ නාසරෙත්හි සිනගෝගයටය. සිනයෝගය හෙවත් ධර්ම ශාලාවේ ප්‍රධානීන් වූයේ පරිසිවරුන්ය. සිනගෝග තුළින් ආගමික දැනුම ලබාදීම, වත් පිළිවෙත් ඉටු කිරීම සිදු කළේය.

- යේසුස් වහන්සේ ගලීල වැසියන් අතර රබ්බි හෙවත් ගුරුවරයෙකු ලෙස ප්‍රසිද්ධ වූ සේක.

- තම සේවය පිළිබඳ පළමු දේශනය කළ යේසුස් වහන්සේ තම දර්ශනය ඉදිරිපත් කළේ (යෙසායා 51:1-2) පද වල උපුටා ගැනීමකිනි. මෙම දිවැස්වැකිය අද සම්පූර්ණ වූයේ යැයි යේසුස් වහන්සේ ප්‍රකාශ කළ අතර, කිතුනු ප්‍රජාව එය නාසරෙත්හි ප්‍රකාශය ලෙස හඳුන්වයි.

- නාසරෙත්හි ප්‍රකාශය මෙසේය. (ශු.ලූක් 4:18-21)

    - දිළිඳුන්ට සුභාරංචිය දේශනා කිරීම.
    - වහලුන්ට මිදීම.
    - අන්ධයන්ට පෙනීම.
    - පීඩිත වූවන්ට මිදීම.
    - ස්වාමීන්ගේ ප්‍රසාද ලත් වසර ප්‍රකාශ කිරීම.

- දේව රාජ්‍යය යුදෙව්වන්ට පමණක් නොව අන්‍යයන් උදෙසා ද වන බව ප්‍රකාශ කිරීම යේසුස් වහන්සේ උදාහරණ 02 ක් ගෙන දේශනා කළ සේක.

    - ශාරපෙත්හි වැන්දඹුවන්ට නියං සමයේ ආශිර්වාද කිරීම.
    - නාමන්ගේ කුෂ්ඨ රෝගය සුව කිරීම.

- මෙම ප්‍රකාශයන් සමඟ සෙනඟ එතුමාට පහර දෙන්නට උත්සාහ කළ විට උන්වහන්සේ පැවසුවේ,

    - ගමේ දිවැසිවරයා ගමට අගේ නැත. (ලූක් 4:24)
    - වෙදතුමාණනි ඔබම සුව කරගන්න. (ලූක් 4:23)

- ඉශ්‍රායෙල් සමාජයේ දේව සේවයට කැප වූවෝ තෙලින් ආලේප කළහ. එසේ ආලේප කළ කණ්ඩායම් 03 කි.
    - පූජකවරු
    - දිවැසිවරු
    - රජවරු

# 10 වන ශ්‍රේණිය - 08 වන පාඩම
# දේව කැඳවීමට ප්‍රතිචාර දක්වමු

- තිබේරියස් විල, ගෙනසෙරෙත් විල යන නම් වලින්ද ගලීල මුහුද හඳුන්වනු ලබන මෙය යේසුස්ගේ සේවයට බොහෝ සේ සමීප වූ ස්ථානයකි.

- උන්වහන්සේ විශේෂ කොට ශ්‍රාවකයන් 12 දෙනෙකු පුහුණු කර සේවයට යැවූ බව දේව වචනයේ සඳහන්ය.

- මෙහි දී පේදුරුගේ කැඳවීම සිදු වූ ආකාරය විශේෂ විය. මසුන් නොමැතිව දැල සෝදමින් සිටි පේදුරුට නැවත දැල් හෙලන ලෙස අණ කළ උන්වහන්සේ මසුන් රාශියක් ඔහුට සැපයූ සේක. නමුත් දේව සේවයට ඔහු කැඳවමින් ''මසුන් අල්ලන්නෙකු නොව මා නුඹ මිනිසුන් දිනන්නෙකු කරමි'' යි පවසමින් උන්වහන්සේ අනුගාමී වන්නට ආරාධනා කළ සේක.

- පේදුරුතුමාගේ කීකරුකම, තම ස්වභාවය හඳුනා ගැනීම නිසා මහත් දේවාශිර්වාද හිමිකර ගත්තේය.

- ප්‍රේරිත යන නමෙහි අර්ථය ''පුහුණු කර යවනු ලැබූ'' යන්නයි. ග්‍රීක භාෂාවෙන් එය ''අපෝස්ටොලොස්'' ලෙස හඳුන්වයි. උන්වහන්සේ තම ශ්‍රාවකයන් තෝරා ගැනීමේ සුවිශේෂත්වය නම්,

  - පෙර දින රාත්‍රිය පුරාවට යාච්ඤාවෙන් යුතුව ගත කිරීම.
  - දීර්ඝ අභියෝගාත්මක ගමනක් සඳහා ඔවුන් තෝරා පත් කිරීම.
  - විවිධ ප්‍රදේශවලින් විවිධ වෘත්තිකයන් විවිධමත දැරූ අයගේ එකතුවක් වීම.
  - විවිධත්වය තුළ එකත්වයකට ඔවුන් පුහුණු කිරීම.
  - තරාතිරම් නොබලා සේවයට තෝරා ගැනීම.

- උන්වහන්සේ දේව රාජ්‍යයේ සුභ අස්න ප්‍රකාශ කිරීම වරක් 12 දෙනෙකුද තවත් වරක් 70 දෙනෙකුද පිටත් කර යැවූ අතර, ඔවුන්ට දුන් අවවාද මෙසේය.

| ශ්‍රාවකයන් 12 දෙනා (ලූක් 9:1-6) | ශ්‍රාවකයන් 70 දෙනා (ලූක් 10:1-2) |
|---|---|
| • සේවයට යන විට ගෙන නොයා යුතු දේ (සැරයටිය, මල්ල, මුදල්, කමිස 2 ක්, රොටි) | • දෙදෙනා බැගින් යැවීය |
| • චාම් සරල දිවි පැවැත්මක් තිබිම | • කලින් සැලසුම් කරගත ප්‍රදේශවලට යැවීම |
| • සුභ අස්න පිළිගන්නා අය සමඟ නතරව සිටීම | • ගෙන නොයා යුතු දේ.(පසුම්බිය, මල්ල, පාවහන්) |
| • පිළිනොගන්නා අයගේ නිවෙස්වල පාදවල දූලි ගසා දමා ඉවත් වන්න. | • පිළිගන්නා අය සමඟ නතර වන්න.<br>• පිළිනොගන්නා අයගෙන් දූලි ගසා දමා ඉවත් වන්න. |
| පැවරූ කාර්යය | පැවරූ කාර්යය |
| • යක්ෂාත්ම දුරු කරන්න | • සේවකයන් ඉල්ලා යාච්ඤා කරන්න |
| • රෝගීන් සුව කරන්න | • නිවෙස්වලට සාමය පතන්න |
| • දේව රාජ්‍ය ප්‍රකාශ කරන්න | • රෝගීන් සුව කරන්න |
| | • දේව රාජ්‍යය ප්‍රකාශ කරන්න |

**01.** ගෝලයන් 12 දෙනා ලියා දක්වන්න.

- සීමොන් (පේදුරු)
- ඇන්ද්‍රෑ
- යොහාන්
- ජාකොබ්
- පිලිප්
- මතෙව්
- බර්තලමෙවු
- තෝමස්
- යාකොබ්
- සීමොන්
- යූදස්
- යූදස් ඉස්කාරියොත්

**02.** යේසුස් වහන්සේ ගෝලයන් හට දුන් උපදෙස් 05 ක් ලියන්න.

- සේවා චාරිකාව සඳහා ගෙන නොයා යුතු දේ (සැරයටිය,මල්ල,රොටි මිල මුදල්,කමිස 2ක්)
- චාම් පැවැත්මක් පවත්වා ගත යුතු විය.
- සුභ අස්න පිළිගන්නා අය සමග නතර ව සිටින්න.
- කලින් සැලසුම් කර ප්‍රදේශ තෝරා ගන්න.
- පිළිගන්නා අය සමග නතරව සිටින්න.

**03.** ඔවුන්ට ඉටුකිරීම පැවරූ කාර්යයන් මොනවාද?

- රෝගීන් සුව කිරීම
- සේවකයන් ඉල්ලා යාච්ඤා කිරීම
- දේව රාජ්‍යය පැමිණ තිබෙන බව දැක්වීම
- නිවෙස්වලට සාමය පැතීම

# 10 වන ශ්‍රේණිය - 09 වන පාඩම
# සමාජයට තව අරුතක්

- කිතුනු පවුලේ නිර්මාතෘවරයා දෙවියන්වහන්සේය. උන්වහන්සේ අවුරුදු 29 ක් පුරා තම පවුල තුළ හැදී වැඩී කිතුනු පවුලක පැවැත්ම අත්විඳි සේක.

- නමුත් සේවයට පා තැබීමෙන් පසු ලේ නෑකම සීමා නොවන පවුල් සංකල්පයක් උන්වහන්සේ පෙන්වා දෙමින් ''මාගේ මෑණියොත් සහෝදරයොත් නම් දේව වචනය අසා පිළිපදින අය'' යැයි කී සේක.

- එකී අදහස දේව කැමැත්ත ඉටු කරන අය දේව පවුලේ සමීප සබඳතාවයකට ඇතුල්වන බවය.

- යුදෙව් සමාජය පුරුෂාධිපත්‍යය තුළ පෝෂණය වූවකි. යුදෙව් පිරිමි දරුවන් අවුරුදු 12 වන විට වැඩිහිටියෙකු ලෙස සැලකූ අතර, ව්‍යවස්ථාව ඉගෙනීමට, දේව මාලිගාවේ නමස්කාරයට හා මංගල්‍යවලට සහභාගීවීමට අවස්ථාව උදාවිය.

- කාන්තාවන් යුදෙව් සමාජයේ කොන් කරනු ලැබූ පීඩිත කණ්ඩායමක් වූ අතර, යේසුස් වහන්සේ ඔවුන්ට නව අනන්‍යතාවයක් ලබාදෙමින් වචනය ඉගෙනීමට, සේවය කිරීමට අවස්ථාව ලබාදුන් සේක.

    - අනාචාර ස්ත්‍රිය
    - මරියා හා මාර්තා
    - කුදු ස්ත්‍රිය
    - මහලේ රෝගී ස්ත්‍රිය

- එපමණක් නොව යුදෙව් සමාජයේ සුංගම් අය කරන්නන් පිළිකුලට ලක් කළ අතර, සාකෙවුස්, මතෙව් (ලෙවී) වැනි අයට වටිනාකමක් ලබාදුන් සේක.

- දරුවන්ට දේව රාජ්‍යයේ වටිනා ස්ථානයක් ලබාදෙන බව උන්වහන්සේ වදාළ සේක.

**01.** අසිසයේ ෆ්‍රැන්සිස්තුමාගේ යැදුම ලියන්න.

''ස්වාමීනි, මා ඔබගේ උපකරණයක් කරගත මැනව. වෛරයෙන් පිරුණු තැනට ප්‍රේමයද, අසමගිනි ඇති තැනට ශාන්තියද, අවිනිශ්චිතයෙන් යුත් තැනට විශ්වාසයද, බලාපොරොත්තුව යුත් තැනට බලාපොරොත්තුවද, ශෝකය පටලාගත් තැනට ප්‍රීතියද, අඳුරින් වැසී ගති තැනට ආලෝකයද ගෙන යෑමට මට වරම් දුන මැනව.''

# 10 වන ශ්‍රේණිය - 10 වන පාඩම
# ව්‍යවස්ථාවේ හරය ප්‍රේමයයි

- යේසුස් වහන්සේගේ සේවය අරඹන විට පලස්තීනයේ පසුබිම.
  - ජනතාව දේශපාලන වශයෙන් ද ආර්ථික වශයෙන්ද පීඩාවට පත්වී සිටියහ.
  - අවුරුදු 60 ක් පමණ රෝම ආණ්ඩුවට යටත්ව සිටි අතර රෝමයට අධික ලෙස බදු ගෙවීමට සිදුවිය.
  - යුදෙව් නියෝජිතයන් බදු එකතු කිරීමට පත්කර සිටියද, ඔවුන් අනුකම්පාවක් නැතිව කටයුතු කිරීම යුදෙව්වෝ අය බදු අයකරන අය පව්කාරයන් ලෙස සලකන ලදි.
  - රෝම හේවායෝ අසාධාරණ ලෙස දිළිඳුන්ගේ තමන්ගේ වැඩපල කරවා ගත්හ.
  - ආගමික හා සමාජ ගැටුම් නිතර ඇතිවූ අතර, සාමාන්‍ය ජනතාව ඉන් අසරණ බවට පත්විය.
  - උතුරු ඉශ්‍රායෙලයේ සිටි යුදෙව්වන් අන්‍ය ජාතීන් සමඟ මිශ්‍රවීම නිසා ඔවුන් ''සමාරිතයන්'' ලෙස සැලකීම. දකුණේ අය ඔවුන් පහත්කොට සලකමින් නොසලකා හැරීම.
  - නමුත් යුදෙව්වන්ට ආගමික නිදහස ලබාදී තිබිණ. ඔවුන් යුදෙව් ව්‍යවස්ථාව ඉටු කළහ.
  - එකල යුදෙව් ප්‍රධානීන් ලෙස කටයුතු කළේ, පරිසිවරු හා සද්දුසිවරුන්ය.
  - පරිසිවරු (ධර්මශාලා) සිනගෝග මුල් කරගෙන සේවය කළ අතර, ඔවුන් ව්‍යවස්ථාවට පැහිදිලි කරදීම හා හැදෑරීම, ව්‍යවස්ථාවට වාචික නීති එකතු කිරීම, සිනගෝග වල ආගමික වතාවත් වල යෙදීම සිදු කරන ලදි.
  - නමුත් මොවුන් දේව නීතියේ අභ්‍යන්තර හරය වෙනුවට බාහිර දේට මුල් තැන දෙමින් සාමාන්‍ය ජනයා ඉදිරියේ ධර්මිෂ්ඨ අය ලෙස පෙනී සිටින්නට උත්සාහ කළහ.
  - ප්‍රසිද්ධ ස්ථානවල, මංසන්ධිවල, යාච්ඤා කළ අතර තම වස්ත්‍රවල පවා ශුද්ධ ලියවිලි පාඨ ලියා තැබීය.
  - යුදෙව් නොවන අය අපවිත්‍ර යැයි පවසමින් ඔවුන්ගෙන් වෙන්වීමට කටයුතු කිරීම.
  - අන්තවාදිවීමට ජනතාව නිතරම උසිගැන්වීම.
  - යුදෙව් ව්‍යවස්ථාවට ලිවීම හා හැදෑරීම ඔවුන්ටම අයිති දෙයක් ලෙස සැලකීම.
  - සද්දුසිවරු සමඟ විරුද්ධ වූ අතර, යේසුස් වහන්සේට විරුද්ධ වීමට මොවුන් දෙකොටසම එක්විය.

➢ යේසුස් වහන්සේ පිරිසිවරු හා සංවාද කරමින් ඔවුන්ගේ වැරදි නිවැරදි කිරීමට කටයුතු කළ සේක.

| සිදුවීම (බයිබල් පදය) | පරිසිවරුන්ගේ ප්‍රකාශය | යේසුස්ගේ පිළිතුර |
|---|---|---|
| • අංශභාග රෝගියා සුව කිරීම | • පව් කමා කළ හැක්කේ දෙවිඳුන්ට පමණි. ඔබට පව් කමා කළ හැක්කේ කෙසේද? | • පොළොවෙහි පව් කමා කිරීමට මනුෂ්‍ය පුත්‍රයාට බලය ද ඇති බව දැනගන්න. |
| • ලෙවි කැඳවීම (ශු. ලූක් 5:17-26) | • ඔබ අයකැමියන්ද, පව්කාරයක්ද සමඟ කන්නෙත්, බොන්නෙත් මන්ද? | • රෝගීන්ට මිස නිරෝගීන්ට යෙදාගෙන් වැඩක් නැත. මා ආයේ පව්තුන් මිස දමිටුන් පසුතැවි සිත් හරවා ගැනීමට කැඳවීම පිණිස නොවේ. |
| • උපවාස ප්‍රශ්නය (ශු. ලූක් 5:33-39) | • ජොහාන්ගේ ගෝලයෝ නොයෙක් වර උපවාස පවත්වා යාච්ඤා පුද කරති. පරිසිවරුන්ගේ ගෝලයෝත් එසේම කරති. එහෙත් ඔබේ ශ්‍රාවකයෝ කමින් බොමින් සිටිති. | • මනාලයා මඟුල් ගෙදර සිටියදී මනාල පිරිස උපවාසයේ යෙදිය හැකිද? එහෙත් මනාලයා ඔවුන්ගෙන් වෙන් කරනා දවස එයි. ඒ දවසේදී ඔවුන් උපවාස කරනු ඇත. |
| • සබත කඩකිරීමේ ප්‍රශ්නය (ශු. ලූක් 6:1-5) | | |

# 10 වන ශ්‍රේණිය - 11 වන පාඩම

## අභියෝග මැද සේවය

- යේසුස් වහන්සේගේ සේවා කාලය තුලින් සද්දුසිවරුන් එල්ල කළ අභියෝග වලටද උන්වහන්සේ සාර්ථකව පිළිතුරු දුන් සේක.

- සද්දුසිවරු යනු මහා ඇලෙක්සැන්ඩර් රජතුමා තම ග්‍රීක් හමුදාව යොදාගෙන පලස්තීනය (ඉශ්‍රායෙල්ය) ග්‍රීක් අදහස් යුදෙව්වන්ට ආදේශ කිරීමට උත්සාහ ගත් සමයේ එම අදහස් පිළිගත් කණ්ඩායමකි.

- 'සැඩොන්' නම් තැනැත්තාගෙන් මොවුන් පැවැතගෙන එන අතර, ''සද්දුසි'' යන නම භාවිතා කරයි. මොවුන් ඉතා ධනවතුන් වූවාසේම පවුල් කිහිපයකට සීමා විය.

- නායක පූජකයන් (උත්තම පූජකයන්) තෝරා ගත්තේ මොවුන් අතරෙනි. ඒ සඳහා රෝම අධිරාජ්‍යයාගේ අනුමැතිය ලබාගත යුතු හෙයින් ඔවුන් රෝම පාලකයන් සතුටු වන අන්දමින් කටයුතු කිරීමට වග බලා ගත්හ.

- සද්දුසිවරුන් තමන්ගේ ආගමික කේන්ද්‍රස්ථානය ලෙස දේව මාලිගාව තුළ සේවය කරන ලදි.

- ඔවුන් දේව දූතයන් හා ආත්ම පිළිනොගත් අතර, පුනර්ජීවනය ද ප්‍රතික්ෂේප කරන ලදි.

- ලිඛිත ව්‍යවස්ථාව පමණක් තරයේ විශ්වාස කළහ.

### ◈ සද්දුසිවරු යේසුස් වහන්සේට එල්ල කළ අභියෝග

- යේසුස් වහන්සේ දේව මාලිගාව පවිත්‍ර කළ මොහොතේ ඔබ මේ දේවල් කරන්නේ කුමන අධිකාරී බලයෙන්ද නොහොත් එම බලය ඔබට පැවරුවේ කවුද? යැයි ප්‍රශ්න කිරීම.

- අපි අධිරාජ්‍යයට බදු ගෙවිය යුතුද? යන ප්‍රශ්නය සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්නැයි උන්වහන්සේ පිළිතුරු දුන් සේක.

- සත්දෙනෙකුගේ බිරිඳ පිළිබඳ ප්‍රශ්නය ඇසූ විට උන්වහන්සේ පැවසුවේ පුනර්ජීවයේදී විවාහ වීම් නොමැති බවය.

# 10 වන ශ්‍රේණිය - 12 වන පාඩම

# අභියෝග මැද සේවය

## ◈ රාජ තේජසින් යෙරුසෙලමට පිවිසීම

- යේසුස් වහන්සේ අවසන් වතාවට යෙරුසලමට පිවිසුන අතර, ඒ තමන් වහන්සේගේ මෙහෙවර හි අවසන් දින කිහිපය බව උන්වහන්සේ දැන සිටි බැවිනි.
- උන්වහන්සේගේ ජීවිතයේ සිදුවන සෑම දේ දිවැස්වැකි සම්පූර්ණ වීමක් වූ අතර, කලින් සැලසුම් කළ දේ විය.
- (සෙකරියා 9:9) සඳහන් පරිදි එතුමාණෝ කොටළුවෙකු පිට නැගී රජකු සේ යෙරුසලමට ඇතුළු වූ සේක.
- මෙම සිදුවීමේදී සෙනඟ උන්වහන්සේ වෙතින් ඔවුන්ට විමුක්තිය ලැබේ යැයි සිතා ඔල්වරසන් හඬ දෙමින් උන්වහන්සේ පිළිගත්හ.
- නමුත් යුදෙව් ආගමික නායකයෝ තමන් අභිබවා යන නායකයෙකු පහළ වී ඇතැයි සිතා කනස්සලු වූහ.
- උන්වහන්සේ රජෙකු වූයේ රණකාමීත්වය සංකේත්වත් කරන අශ්වයෙකු පිට නොනැඟ අහිංසකත්වය සංකේතවත් කරන කොටළුවකු පිට නැඟ තේජසින් යෙරුසලමට ඇතුළු වූ සේක.

## ◈ දේව මාලිගය පවිත්‍ර කිරීම

- මෙම අවස්ථාවට පෙරද යේසුස් වහන්සේ වරින් වර දේව මාලිගයට වැඩිය අතර, එහි තිබූ දූෂිත පරිසරය ගැන අවබෝධයක් තිබූ සේක.
- එහි ආගමික නායකයන් (සද්දුසිවරු) තම පෞද්ගලික වරප්‍රසාද වෙනුවෙන් ආගමේ මුවාවෙන් ජනතාව සූරා කෑමටත්, වංචනික ව්‍යාපාරවල නියැලීමටත් යොමු වී තිබුණි.
- ඒ මොහොතේ අලෙවියට තිබූ බැටළුවන් හා පරෙවියන් පලවා හැර දේව මාලිගය පවිත්‍ර කළ සේක.
- උන්වහන්සේ පැවසුවේ, ''මගේ ගෘහය යාච්ඤාවේ ගෘහයක්'' යැයි ලියා තිබේ. නමුත් නුඹලා එය සොරුන්ගේ ගුහාවක් කර තිබේ යැයි ලෙසිනි.

## ◈ යේසුස් නැසීමට කුමන්ත්‍රණය කිරීම

- යේසුස් වහන්සේ දේව රාජ්‍යයේ කාරණා තම ශ්‍රාවකයන්ට ඉගැන්වූ නමුත් සත්‍ය වටහා ගැනීමට ඔවුහු අපොහොසත් වූහ.
- ශ්‍රාවකයන් පවා අපේක්ෂා කළේ දේව රාජ්‍යයක් ලෙස මෙලොව භූමිකාව රෝම රාජ්‍ය පලවා හැර යේසුස් වහන්සේ රජකම් කරනු ඇත කියාය.
- එය ඉටු නොවුණු කළ ශ්‍රාවකයෝ පවා කනස්සලු වූහ.
- පසුව යූදස් මුදලට උන්වහන්සේ පාවා දීමට කැමති විය.
- හෝසන්නා කියා මොර ගැසූ අය උන්වහන්සේව ''කුරුසියේ ඇණ ගසන්න'' කියා පැවසූහ. උන්වහන්සේ එපා කර බරබ්බස් සොයා නිදහස් කර ඉල්ලුවේය.
- නමුත් මේ සියල්ල සිදුවූයේ, පෙර නියම කළ ලෙසට දිවැස්වැකි වලට අනුකූලවට.
- සත්‍ය නම් උන්වහන්සේගේ රාජ්‍යය ලෞකික දේට ආශා වී ලබාගත නොහැකි බවයි.

# 10 වන ශ්‍රේණිය - 13 වන පාඩම
# ගෙත්සෙමන යාච්ඤාවෙන් සවිය

- සැබෑ මනුෂ්‍යයෙකු ලෙස යේසුස් වහන්සේ හට බඩගින්න, පිපාසය, දුක, සතුට මෙන්ම මරණයේ වේදනාවද හොඳින් දැනුණි. එවන් අවස්ථාවල යේසුස් වහන්සේ ශක්තිය ලබාගන්නේ දෙවිඳුන්ට යාච්ඤා කිරීමෙනි.

- උන්වහන්සේ මරණයට පත් කරන අවස්ථාව ගැන එතුමා හොඳින් දැන සිටි අතර, ඒ සඳහා උන්වහන්සේ ඕනෑකමින් යාච්ඤා කළ අතර, ඒ මොහොතේ එතුමාණන්ගේ දහඩිය ලේ බවට පත්ව බිමට වැටුණේය. ඒ ඔලීව කන්දේ ගෙත්සෙමන නම් උයනේදීය.

- නිතරම උන්වහන්සේ ඉල්ලා සිටියේ ''මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා'' කියාය. එනම් මරණය හා දුක්විදීම් උන්වහන්සේ කැමැත්තෙන් පිළිගත් සේක.

- යුදෙව්වරු සිතුවේ දුක්විඳීමට සිදුවන්නේ දේව කැමැත්තට විරුද්ධව කටයුතු කරන අයට බවය. නමුත් යේසුස් දුක් වින්දේ අන් අයගේ යහපත උදෙසාය. උන්වහන්සේගේ දුක්විඳීම නිසා දේව රාජ්‍යයේ උරුමයන් මනුෂ්‍යයාට හිමි විය.

- උන්වහන්සේ පහළට එන විට ගෝලයන් නිදා සිටිනු දැක දුකට පත්ව ''පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න'' යැයි ඔවුන්ට කී සේක. එනම් අභියෝග වලට මුහුණදීමට නම් යාච්ඤාවෙන් ශක්තිමත් වීමේ වැදගත්කම උන්වහන්සේ ප්‍රකාශ කළ සේක.

- උන්වහන්සේගේ ගෝලයෙක් වූ යුදස් උන්වහන්සේ සිඹීමකින් පාවා දුන්නේය. සාමාන්‍යයෙන් යුදෙව්වෝ ගෞරවයෙන් පිළිගැනීමට සිඹීම සිරිත වුවත් මෙම සිඹීම පාවාදීමේ සිඹීමක් විය.

- උන්වහන්සේ යුදස්ට අනුකම්පා කළ සේක. පේදුරු උත්තම පූජකයාගේ කන කපා දැමූ අවස්ථාවේ ගෝලයාට තරවටු කොට ඔහු සුවපත් කළ සේක.

- තමා අත්අඩංගුවට ගන්නට පැමිණි අයට උන්වහන්සේ නිර්භීතව කතා කළ සේක. මේ නිර්භීතකම උන්වහන්සේට ලැබුණේ යාච්ඤාව තුළිනි.

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය

# 10 වන ශ්‍රේණිය - 14 වන පාඩම

# විනිශ්චය හා කුරුසිපත්වීම

- පේදුරුතුමා යේසුස්ගේ ප්‍රධානතම ගෝලයා මෙන්ම උන්වහන්සේට මහත් සේ ප්‍රේම කල ගෝලයාය. එතුමා යේසුස් වහන්සේ ගැන මනා අවබෝධයකින් පසුවිය.

  ''ඔබ දෙවියන්වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝය'' යන ප්‍රකාශයෙන් ඒ බව පැහැදිලි වේ.

- එබැවින් යේසුස් වහන්සේගේ තමාගේ මෙහෙවර ඉදිරියට කිරීමේ වගකීම ගෝලයන්ට පැවරූ සේක. නමුත් සාතන් ගෝලයන්ගේ සිත වරදට පොළඹවන බව උන්වහන්සේ දැනසිටි සේක. නමුත් උන්වහන්සේ පැවසුවේ ''යලිත් ඔබ හැරුණු පසු ඔබේ සහෝදරයන් ධෛර්මත් කරන්න'' යනුය.

- පේදුරු යේසුස් වහන්සේ වෙනුවෙන් මරණයට පත්වීමට වුවද සූදානම් විය. නමුත් එතුමා යේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් බැහැර වී පරීක්ෂාවට ලක්වන බව යේසුස් දැන ඔහුකෙරෙහි යාච්ඤා කළ බවද පැවසූ සේක.

- යේසුස් වහන්සේ කුරුසපත් කරන මොහොතේ අනපේක්ෂිත ලෙස උන්වහන්සේ කුරුසිය කර ගසාගෙන යාමට කිරේනියේ සීමොන්ට සිදු විය.

- යෙරුසලමේ ස්ත්‍රීන් පමණක් උන්වහන්සේ අත් නොහැර හඬමින් උන්වහන්සේ පසුපස ගිය අතර, උන්වහන්සේ ඔවුන්ට පැවසුවේ තමන්ගේ අනාගත පරපුර උදෙසා හඬන ලෙසය.

# 10 වන ශ්‍රේණිය - 15 වන පාඩම

## දුක් ප්‍රාප්තියට ප්‍රතිචාර

- යේසුස් වහන්සේගේ නීතිය ඉදිරියේ වරදකරුවෙකු කොට මරණයට තීන්දුව දී අසාධාරණ ලෙස කුරුස පත් කිරීමට නියම කළද, ඊට නොසැලී එඩිතරව මුහුණ දුන් සේක.

- උන්වහන්සේගේ දුක් ප්‍රාප්තියට විවිධ අයුරින් හවුල් වෙමින් ප්‍රතිචාර දැක්වූ පිරිසක් විය. ඉන් පේදුරුට හිමි වන්නේ ප්‍රමුඛ තැනකි.

  - පේදුරු යේසුස් වහන්සේ ගැන මනා අවබෝධයකින් සිටියේය. යුදෙව් ජනතාව ගැලවුම්කරුවකුගේ පැමිණීම ගැන බලාපොරොත්තුවෙන් සිටි අතර, යේසුස් වහන්සේ තුළින් එය ඉටු වූ බව පේදුරු පැවසුවේය.

    ''ඔබ දෙවියන්වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝය''

  - වරක් උන්වහන්සේ වෙනුවෙන් මරණයට පත්වීමට පවා සූදානම් බව පේදුරු පැවසුවේය. ඔහු ඉදිරියේදී අධෛර්යට පත්වන බව දැන සිටි යේසුස් වහන්සේ ප්‍රකාශ කළේ,''ඔබ යළිත් හැරුණු පසු සහෝදරයන් ධෛර්යමත් කරන්න'' ලෙසය. උන්වහන්සේ අත්අඩංගුවට ගත් විට පේදුරු තෙවරක් උන්වහන්සේ නාඳුනන බව ප්‍රකාශ කිරීමෙන් එය තහවුරු වේ.

- යේසුස් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය නැතිවීම මනුෂ්‍යයෙනකුට ඇති විශාලම පරීක්ෂාවයි.

  - මෙවැනි පරීක්ෂාවන් පැමිණෙන බව දැන උන්වහන්සේ''පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න'' යැයි පේදුරුට පැවසූ සේක.

- පාස්කු මංගල්‍යයට සහභාගී වීමට පැමිණි ''කිරේනියේ සීමොන්'' හට යේසුස් වහන්සේගේ කුරුසිය උසුලාගෙන ගොස් එතුමන්ට උපකාර කිරීමේ අවස්ථාව උදාවිය. අපට නොසිතූ අවස්ථාවල උන්වහන්සේගේ සේවයට දායකවීමට අවස්ථාවන් උදාවනු ඇත. එය මඟ නොහැර ඉටුකිරීම වාසනාවන්ත ක්‍රියාවකි.

- උන්වහන්සේ පසුපස ගිය ස්ත්‍රීන් උන්වහන්සේ ගැන හඬා වැළපුන නමුත්, උන්වහන්සේ පැවසුවේ උන්වහන්සේ නොදැන නිරයට යන මඟ සිටින දරුවන් ගැන හඬා වැලපෙන ලෙසය.

- උන්වහන්සේ දෙපස සිටි සොරුන් දෙදෙනාගෙන් කෙනෙක් උන්වහන්සේට අපහාස කළ අතර, අනෙක් පුද්ගලයා පැවසුවේ උන්වහන්සේ රාජශ්‍රීයෙන් එනකල තමා සිහිකරන ලෙසය. ඒ ඉල්ලීමට උන්වහන්සේ එම මොහොතේම පිළිතුරු දුන් සේක.

- එතැන් සිටි මුර සෙබළුන් උන්වහන්සේට කාඩි පොවා ''ඔබ යුදෙව්වන්ගේ රජ නම් ඔබව ගළවාගන්න'' යැයි කීය.

- උන්වහන්සේ ''මොවුන් නොදැන කළ වරදට සමාව දෙන්න'' යැයි පැවසූ සේක.

- අවසානයේ ''මාගේ ආත්මය ඔබට භාරදෙමි'' යි පවසා අවසන් හුස්ම හෙළූ සේක.

- අරිමාතියේ යෝසෙප් උන්වහන්සේගේ සිරුර ගෙන රෙදිවලින් ඔතා සොහොන් ගෙයක තැන්පත් කළේය.

## 10 වන ශ්‍රේණිය - 16 වන පාඩම

## නව බලාපොරොත්තු

- යුදෙව් අධිකරණය කුරුසපත් කිරීමට යේසුස් වහන්සේ කෙරෙහි එල්ල කළ චෝදනා.
    - දෙවියන් හට අපහාස කිරීම
    - රෝම රාජ්‍යයට විරුද්ධව කැරලි ගැසීම
    - යේසුස් යුදෙව්වන්ගේ රජ යැයි පැවසීම

- ඉහත චෝදනා වලට වරදකාරයකු ලෙස කුරුසියේ ඇණ ගසා උන්වහන්සේ මරණයට පත් කළේ උන්වහන්සේගේ මෙහෙවර නිමා කර දැමීමටය.

- නමුත් උන්වහන්සේ දින 03 කට පසු මරණය පරාජය කොට නැගටුණ සේක. මේ පිළිබඳව උන්වහන්සේ කිහිපවතාවක්ම ගෝලයන්ට ප්‍රකාශ කළ සේක.

- සතියේ පළමු වන දින හිමිදිරියේ උන්වහන්සේගේ ශරීරයේ ආලේප කිරීමට සුවඳ ද්‍රව්‍යද රැගෙන මද්ගලායේ මරියා, මව් මරියා ඇතුලු කාන්තාවෝ සොහොන් ගෙයට ගියහ.

- එතැනින් දර්ශනය වූ දේව දූතයා ''ජීවමාන තැනැන්වහන්සේ මළවුන් අතර සොයන්නෙ මන්ද? උන්වහන්සේ මෙහි නැත. උත්ථාන වූ සේක'' යැයි පැවසීය.

- පසුව ඔවුන් ගලීලයට යන මාර්ගයේදී යොසුස් වහන්සේව මුණ ගැසුණු අතර, පේදුරුට හා ගෝලයන්ට දන්වන ලදි.

- එම්මාවුස් ගමෙහි සිටි ක්ලෙයෝපස්ට හා තවත් ගෝලයකුට උන්වහන්සේ දර්ශනය වූ සේක. ඔවුන් ඒ පුවත ගෝලයන්ට පැවසුවේ ''ඒකාන්තයෙන්ම සමිඳාණන් වහන්සේ නැගයුණ සේක'' යනුවෙනි.

- පසුව ගෝලයන් රැස්ව සිටි ස්ථානයට ද දර්ශනය වූ අතර, ස්පර්ශ කර බලා ඒ බව විශ්වාස කළේය.

- පසුව තෝමස් ''මාගේ දෙනියනි, මාගේ ස්වාමිනී'' ලෙස උන්වහන්සේ ඇමතීය. උන්වහන්සේ දෙවියන්වහන්සේ බවට සාක්ෂි දැරූ පළමු ගෝලයා මොහු විය.

## 10 වන ශ්‍රේණිය - 17 වන පාඩම

## ශුද්ධාත්ම අනුභසට විවෘත වෙමු

- ශුද්ධ බෞතීස්මය කිතුනු අනුගාමිකයන්ට ආවේණික වූ උතුම් පිළිවෙතක් වන අතර එය හුදෙක් බාහිර සංකේතයක් පමණක් නොවිය යුතුය.
- කිතුනුවන් බෞතීස්මය ලැබීම තුළින් ශුද්ධාත්ම අනුභසට ලක්වේ.
- ස්නාවක යොහාන්තුමාගේ කාලයේ දී පිරිසිදු වීමේ බාහිර සංකේතයක් ලෙස බෞතීස්මය පැවති අතර, යොහාන්තුමා ඊට නව අරුතක් දෙමින් ''පසුතැවිලි වී බෞතීස්මය ලබන ලෙසත්, පසුතැවිල්ලට සුදුසු ඵල උපදවන ලෙසත්'' දේශනා කළේය.
- යොහාන්තුමා සෙනඟ බෞතීස්ම කළේ ජෝර්දාන් නදීයේදීය.
- උන්වහන්සේ පැවසුවේ තමා වතුරෙන් බෞතීස්ම කළ නමුත් යේසුස් වහන්සේ ශුද්ධාමයෙන් හා ගින්නෙන් ජීවිත පවිත්‍ර කරන බවය.
- ඉන් ලැබෙන ධෛර්ය, බලය තුළින් නිර්භීතව සාක්ෂි දැරීමට කිතුනුවාට හැකියාව ලැබේ.

### ❖ යේසුස් වහන්සේගේ බෞතීස්ම ලැබීමේ අරමුණු

- ස්නාවක යොහාන්තුමාගේ සේවය අනුමත කරන බව.
- උන්වහන්සේගේ යටහත්කම ප්‍රකාශ කිරීමට.
- බෞතීස්මය තම අනුගාමිකයන්ද කළ යුතු බවට ආදර්ශයක් දීම.
- ස්වර්ගය උන්වහන්සේගේ මෙහෙවර අනුමත කළ බව.

### ❖ ශුද්ධාත්ම අනුභසට ලක්වූවකුගේ ජීවිතයේ තිබිය යුතු දේ

- දේව වචනයට අනුව ජීවත් වීම.
- ශුද්ධාත්මයාණන්ට කීකරු වීම.

- දේව ගුණාංග ජීවිතය තුළ ඔප්නැංවීම.

## 10 වන ශ්‍රේණිය - 18 වන පාඩම

## පරීක්ෂා වලින් ජය ගනිමු

කිතුනු දරුවෙකු ලෙස සමාජයේ ජීවත් වීමේ දී විවිධ පරීක්ෂාවන්ට මුහුණදීමට අපට සිදු වේ. අප දෙවියන් වහන්සේ තුළ පරීක්ෂාවන්ට මුහුණ දිය යුතු ආකාරය විමසා බැලීමට කදිම උදාහරණයක් ඇත.

යේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා යේසුස් වහන්සේ ජයගත් ආකාරය විමසා බලමු.

දින 40 ක් පුරා යේසුස් වහන්සේ නිරාහාරව පාළුකරයේ සිටියේය. මෙම අවස්ථාවේදී යක්ෂයා යේසුස් වහන්සේව පරීක්ෂා කරයි.

### 01. පළමු පරීක්ෂාව

යක්ෂයා : මම මේ ගල්, රොටි වෙන්න අණ කරමි. එමගින් ඔබගේ කුසගින්න නිවා ගන්න යැයි පැවසීය.

යේසුස් වහන්සේ : මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව දෙවියන්වහන්සේගේ මුවින් නික්මෙන සියලු වචන වලින්ය.

### 02. දෙවන පරීක්ෂාව

යක්ෂයා : උන්වහන්සේ උස් තැනකට ගෙනවිත් ''මේවා කෙරෙහි මුළු ආධිපත්‍යයද, ඒවායේ යස ඉසුරු ද ඔබට දෙන්නෙමි'' ඔබ මා ඉදිරියේ නමස්කාර කරන්නැයි කීවේය.

යේසුස් වහන්සේ : ''නුඹේ දෙවි වන ස්වාමීන් වහන්සේට පමණක් නමස්කාර කරන්න, උන්වහන්සේට පමණක් සේවය කරන්නැයි'' දේව වචනයේ ලියා තිබේ යැයි කී සේක.

### 03. තුන්වන පරීක්ෂාව

යක්ෂයා : දේව මාලිගාවේ කොත මුදුනින් පනින්න. ''ඔබ රකිනා පිණිස එතුමාණෝ සිය දූතයන්ට අණ දෙන සේකැයි'' කීවේය. ''ඔබේ දෙපා ගල්වල නොහැප්පෙන පිණිස ඔවුන් සියතින් උසුලා ගනිවී.''

යේසුස් වහන්සේ : ''නුඹේ දෙවි වන ස්වාමීන් වහන්සේ පරීක්ෂා නොකරන්න'' යැයි කී සේක.

මෙම පරීක්ෂා තුන දෙවියන්වහන්සේ තුළ යේසුස් වහන්සේ ශුද්ධ ලියවිලි උපයෝගී කර ගනිමින් ජයගත් ආකාරය අපට ද මහත් ජයග්‍රහණයකි.

අප ජීවිත ගමනේදී විවිධ අවස්ථාවල පරීක්ෂාවන්ට මුහුණදීමට සිදු වේ. කිතුනු අනුගාමික අප ද ශුද්ධාත්මයාණන්ගේ මග පෙන්වීම සෙවිය යුතු වේ. දේව වචනය නිසි ලෙස අවබෝධ කරගෙන ඒවා තුළ දේව මගපෙන්වීම සොයා ගැනීමට උත්සහ කළ යුතු වේ. දේව රාජ්‍යයේ දරුවෙකු ලෙස පරීක්ෂා ඉදිරියේ දේව කැමැත්තට යටත්වීමට ඉගෙන ගත යුතු වේ.

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය

## 10 වන ශ්‍රේණිය - 19 වන පාඩම

# නිවැරදි දැක්ම තුළින් ජීවිත නවෝදය

- ශු.ලූක් 9:28-36
- මිහිමත උන්වහන්සේ ප්‍රධානතම කාර්යය වූයේ දේව රාජ්‍යය ගොඩනැගීමයි.
- සීමොන් පේදුරු කළ මනා ප්‍රකාශනය නම්, ''ඔබ දෙවියන්වහන්සේ ක්‍රිස්තුස්වරයාණෝය'' යනුය.
- නිරන්තරයෙන්ම එදා සිට යුදා ජනතාව උන්වහන්සේ කවුද? යන ප්‍රශ්නයට පිළිතුරු සොයමින් සිටියහ. නමුත් උන්වහන්සේ තමන් කවුරුන්ද යන වග ජීවත්ව සිටින සමයේ හෙළි කළේ සුළු පිරිසකට පමණය. විශේෂයෙන්ම ගෝලයන්ට ඒ බව එළිදරව් කළ සේක.
- මෙසේ සත්‍යතාවයේ ආලෝකයාණන් අනාවරණය වූ අවස්ථාවකි, උන්වහන්සේගේ රූප විපර්යාසය සිදු වූ අවස්ථාව.
- උන්වහන්සේගේ තේජශ්‍රීය ප්‍රකාශිත සංකේතය වන්නේ මුහුණුවර වෙනස්වීම හා වස්ත්‍ර ධවල කාන්තියෙන් බැබලීමය.
- එලියා දිවැසිවරයාගෙන් දිවැසාවලිය හා මෝසෙස්ගෙන් ව්‍යවස්ථාවලිය සම්පූර්ණවීම හා උන්වහන්සේ එය පිළිගත් බව සංකේතවත් වේ.
- ඔවුන් තිදෙනා සාකච්ඡා කරමින් සිටියේ ඉදිරියේ යෙරුසලමේ ඉටු කරන්නට යන ජීවිත පූජාව ගැනය.
- වලාපටලයෙන් සංකේතවත් වන්නේ, දේව අභිමුඛත්වයයි
- ඒ මොහොතේ ස්වර්ගයේ නැගුණු හඬ මෙසේය, ''මොහුට සවන් දෙන්න මේ ඔබේ පුත්‍රයාණෝය.''
- එතැන සිටි ගෝලයන් වූයේ පේදුරු, යාකොබ් හා යොහාන්ය. ඔවුන්ට අවශ්‍ය වූයේ ඔවුන්ට මණ්ඩප 03 ක් සෑදීමය. නමුත් යේසුස් වහන්සේ අවධාරණය කළේ, මෙලොව සේවය සම්පූර්ණ වීමට යෙරුසලමට යා යුතු බවත් ය.
- මෙම සිදුවීමෙන් යේසුස් වහන්සේ කවුරුන්ද යන්න නිවැරදි අවබෝධයක් ලබාගැනීමට මඟපෙන්වීමක් ලැබීය.
- මෙම අත්දැකීම තුළින් යේසුස් වහන්සේ ආලේපලත් මෙසියස්වරයාණන් බව ගෝලයන් දැක ගත්හ.

මෙම අවස්ථාවේ අනාවරණය වූ විශේෂ සිදුවීම් ලියන්න.

# 10 වන ශ්‍රේණිය - 20 වන පාඩම

# දේව රාජ්‍යයේ වර්ධනය

➢ අපගේ ජීවිත වල මූලික අරමුණ විය යුත්තේ දේව රාජ්‍යය උරුම කර ගැනීමයි.

➢ එය උරුම කරගැනීමට කළ යුතු දේ ගැන යේසුස් වහන්සේ ඉගැන්වූ අතර, උන්වහන්සේගේ දේශනා වල මූලික හරය දේව රාජ්‍යය සංකල්පයයි. ඒ පිළිබඳ මෙසේ සුබසුන් වල සඳහන්ය.

- උන්වහන්සේගේ රාජ්‍යයට කෙළවරක් නැත.
- උන්වහන්සේ එවන ලද්දේ සුබ අස්න ප්‍රකාශ කරන ලෙසය.
- දෙවියන්ගේ රාජ්‍යය ප්‍රකාශ කරන පිරිසක් රෝගීන් සුවකරන පිණිසත් ඔවුන් යැවූ සේක.

| දේව රාජ්‍යය | ලෞකික රාජ්‍යය |
|---|---|
| • ආධිපත්‍ය දෙවිඳුන් සතුය. | • ආධිපත්‍ය පුද්ගලයෙකු සතුය. |
| • පුරවැසිභාවය දේව කැමැක්ක ඉටුකරන අයටය. | • අදාළ රටේ අයටය. |
| • නිශ්චිත භූමි ප්‍රමාණයක් නැත. | • නිශ්චිත භූමි ප්‍රමාණයක් ඇත. |
| • ප්‍රේමය මත ව්‍යවස්ථාව පදනම් වී ඇත. | • නීතිරීති ව්‍යවස්ථාවට අඩංගුය. |

➢ දේව රාජ්‍යය යනු යේසුස් වහන්සේගේ පාලනයට යටත් වූ සෙනඟක් ජීවත්වන ස්ථානයකි. දේව රාජ්‍යය පවතින්නේ දේව සෙනඟ අතර වේ.

➢ දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳ යේසුස් වහන්සේ පැවසූ උපමා හා එහි අර්ථය

- අබ ඇටයේ උපමාව
  → දේව රාජ්‍යය ඉතා සුළුවට ආරම්භ වී විශාලව වර්ධනය වන බව.

- මුහුන් පිළිබඳ උපමාව
  → දේව රාජ්‍යයේ ක්‍රියාවන් දේව බලයෙන් අප නොසිතන ලෙස සිදුවන බව.

- වපුරන්නාගේ උපමාව
  → දේව රාජ්‍යයට කුමන බාධා පැමිණියද ක්‍රමානුකූලව බාධා පසු කරමින් වර්ධනය වන බව.

## ◈ දේව රාජ්‍යයේ වර්ධනය ඇතිවීම අප,

➢ යේසුස් වහන්සේගේ දැක්ම තුළ ජීවත් විය යුතුය.

➢ යේසුස් වහන්සේගේ අධිකාරීත්වයට නතු විය යුතුය.

➢ දේව වචනය තුළ දිනපතා මුල් බැස ආසිරි ලබාගැනීම.

➢ යාච්ඤාවෙන් හා ඇදහිල්ලෙන් දේව කැමැත්ත සෙවීම.

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය

## 10 වන ශ්‍රේණිය - 21 වන පාඩම

# දේව රාජ්‍යයේ ලකුණු හා ප්‍රාතිහාර්යය

- යේසුස් වහන්සේගේ ප්‍රාතිහාර්යයන් කරන ලද්දේ දේව රාජ්‍යයේ ලකුණු ලෙසිනි.
- යේසුස් වහන්සේ ප්‍රාතිහාර්යයන් කිරීමේ අරමුණ වූයේ,
  - දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා
  - මිනිසුන් වෙත වූ අසීමිත ප්‍රේමය නිසා
- ප්‍රාතිහාර්යයන් තුළින් උන්වහන්සේ පෞද්ගලික මහිමය හෝ ගෞරවය අපේක්ෂා නොකළ සේක.
  - ප්‍රාතිහාර්යයන් අපේක්ෂාවෙන් තමා වෙත නොඑන ලෙස දැඩිව ජනතාවට කීම.
  - සිය නම හෙළි නොකරන ලෙස අශුද්ධාත්ම වලට අණ කිරීම.
  - තමා කළ හාස්කම් අන් අයට නොකියන ලෙස කීම.
- ප්‍රාතිහාර්යයන්ට ග්‍රීක බසින් ඩුනොමිස් ලෙසද සේමෙයොන් යන වදන ද භාවිතා කරයි. එහි අර්ථය දේව බල සලකුණු යනුය.
- ශු. යොහාන්තුමා භාවිතා කළේ, සේමෙයොන් යන වදනයි.
- උන්වහන්සේ කළ ප්‍රාතිහාර්ය කාණ්ඩ 04 ක් යටතේ වර්ග කළ හැක.
  - සුව කිරීම් - 20
  - අශුද්ධාත්ම දුරු කිරීම් - 04
  - සොබාදහම අභිබවා කළ ක්‍රියා - 05
  - මරණින් නැගිටුවීම් - 03

**01.** අවස්ථා සම්බන්ධය ලියන්න.

1. ''මුළු ඉශ්‍රායෙල් ජනතාව අතර පත් මෙතරම් ශ්‍රද්ධාවක් මා දැක නැත'' (ශු. ලූක් 7:7)

2. ''දාවිත්ගේ පුත්‍රයාණෙනි, මට අනුකම්පා කළ මැනව'' (ශු. ලූක් 18:31)

**02.** ප්‍රාතිහාර්යයන් අත්දැකීමට ඔබ තුළ තිබිය යුතු ගුණාංග 05 ක් ලියන්න.

- ශ්‍රද්ධව සිටීම
- උන්වහන්සේ විශ්වාස කිරීම
- පාපයෙන් ගැලවී සිටීම

| සුව කිරීම් | අශුද්ධාත්ම දුරු කිරීම් | සොබාදහම අභිබවා | මරණින් නැගිටුවීම් |
|---|---|---|---|
| • වියළි අතක් ඇති මනුෂ්‍යයෙකු සුව කිරීම | • | • කුණාටුව නිශ්චල කිරීම | • යායිරස්ගේ දියණිය |
| • දිය උදර රෝගියෙකු සුව කිරීම | | • පන්දහසකට කන්ට දීම | |
| • මහ ලේ රෝගී ස්ත්‍රිය සුව කිරීම | | • හාරදහසකට කන්ට දීම | |

# 10 වන ශ්‍රේණිය - 22 වන පාඩම

# දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති

- යේසුස් වහන්සේගේ දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති හා අපේක්ෂණ වරින් වර ශ්‍රාවකයන් වෙත හෙළිදරව් කළ සේක.

- දේව රාජ්‍යයේ කාරණා ඉගැන්වීමට උන්වහන්සේ භාවිතා කළ ක්‍රමවේද නම්,
    - උපමා භාවිතය
    - දේශනා ක්‍රමය
    - ප්‍රාතිහාර්යයන් කිරීම
    - ජීවිතාදර්ශයෙන් ඉගැන්වීම

- මහා මංගල භෝජනය පිළිබඳ උපමාව ප්‍රකාශ කරන ලද්දේ පරිසිවරයෙකුගේ නිවසේ භෝජන සංග්‍රහයකට සහභාගී වූ අවස්ථාවේදීය. එහි දී කෙනෙක් දෙවියන්ගේ රාජ්‍යයෙහිදි ආහාර පළඳන තැනැත්තේ භාග්‍යවන්තයෙකැයි කී අවස්ථාවේ මෙම උපමාව පැවසූ සේක.

- මෙහි ලූක් තුමා විසින් ඉදිරිපත් නොකරන කාරණයක් ඉදිරිපත් කරයි. එනම්,
    - මගුල් මඩුව අමුත්තනගෙන් පිරී යාම
    - මගුල් ඇඳුම ඇඳ නැති කෙනෙකු සිටීම හා ඊට රජු දැඩි පියවර ගැනීමත්ය.

- එකල සාමාන්‍ය සිරිත රජු විසින් ආරාධිත අයට මගුල් ඇඳුම් පිරිනැමීමයි. එම මගුල් ඇඳුම ප්‍රතික්ෂේප කිරීම රජුට හා උත්සවයට කරනු ලබන නිග්‍රහයක්/අවමානයක් ලෙස සලකයි.

- මෙම උපමාවෙන් හෙළි වන අපේක්ෂණ
    - දේව රාජ්‍යය සියල්ලන්ට විවෘතට
    - දේව රාජ්‍යයට කැඳවන්නේ දෙවියන්ය.
    - ලෞකික දේ නිසා දෙවියන් ප්‍රතික්ෂේප කරන අයට දෙවියන්ගේ ආසිරි හිමි වේ.
    - දේව රාජ්‍යයට කැඳවීම ලැබූවන් ධර්මිෂ්ඨකමින් හා ගැලවීමෙන් සැරසී සිටි යුතුය.

- දේව රාජ්‍යයේ ප්‍රතිපත්තියක් වන නැති වූවන් සොයා යෑම පිළිබඳව ඉගැන්වීමට උන්වහන්සේ යොදාගත් උපමා
    - නැති වූ බැටළුවා
    - නැති වූ කාසිය
    - නැති වූ පුත්‍රයා (අකීකරු පුත්‍රයා)

කිතුණුවකු ලෙස ඔබ අනුගමනය කළ යුතු දේව රාජ්‍යය ප්‍රතිපත්ති  ලියන්න.

- දේව ප්‍රේමයට නිරතුරුවම ප්‍රතිචාර දැක්වීම හා අත්දැකීම
- ඒ අත්දකින ප්‍රේමය පිළිබඳ සුපුවත අන් අය වෙත ගෙන යාම.



**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

# දේව රාජ්‍යයේ පුරවැසියන්

- දේව රාජ්‍යයේ පුරවැසියකම උරුම කරගැනීම කිතුනු අපගේ අභිලාෂයයි. ඒ සඳහා අපගෙන් ඉටුවිය යුතු මෙහෙවර අප හඳුනා ගත යුතුය.

- එනම් අප යේසුස් වහන්සේ ඉගැන්වූ නව නායකත්ව ක්‍රමවේදයන් ඔස්සේ ජීවත් වෙමින් දේව රාජ්‍යයේ පුරවැසිකම ලබාගත යුතුය.

- සාමාන්‍ය ලෝකයේ නායකත්වය හා දේව රාජ්‍යයේ නායකත්වය දැරීම හාත්පසින්ම වෙනස්ය.

| සාමාන්‍ය ලෝකයේ නායකත්වය | දේව රාජ්‍යයේ නායකත්වය |
|---|---|
| • නායකයා අණසක පතුරවයි | • සාමකාමීව සහයෝගයෙන් කටයුතු කරයි |
| • ආධිපත්‍ය දරයි | • ප්‍රේමයේ ආධිපත්‍ය දරයි |
| • යටත් අය නායකයාට සේවය කරයි. | • නායකයා යටත් සේවය කිරීමට බැඳී සිටියි. |
| • නායකයා සේවය ලබයි. | • යටත් අය සේවය ලබයි. |
| නායකයා  යටත් අය | යටත් අය  නායකයා |

- නායකයන් පිළිබඳ යේසුස් වහන්සේ ලබාදුන් උපදෙස් (ශු. ලූක් 22:24)
  - ශ්‍රේෂ්ඨ තැනැත්තා ඉතා සුළු තැනැත්තා වේ.
  - නායකයා සේවකයා විය යුතුය.
  - අන් අය කෙරෙහි බලය පෑමට අවසර නැත.

- යේසුස් වහන්සේ සේවක නායකත්වය ආදර්ශයෙන් පෙන් වූ අවස්ථා,
  - කුඩා දරුවෙකු අගය කිරීම (ලූක් 8:42)
  - ශ්‍රාවකයන්ගේ පාද සේදීම (ශු.යොහාන් 13:4-5)
  - සේවය අවශ්‍යතා ඇති අය වෙතට යාම.
  - බොහෝ දෙනාගේ මිදීම උදෙසා තම දිවිය පූජා කිරීම.

- දේව රාජ්‍යයේ පුරවැසියන්ගෙන් අපේක්ෂිත චරිත ලක්ෂණ
  - අන් අය වෙනුවෙන් වැයවීම කාලය/ශ්‍රමය/සම්පත් වැය කිරීමට සිදුවනු ඇත. (සමාරිතයාගේ උපමාව) ශු. ලූක් 10:25-37

  - ස්ථානෝචිත ප්‍රඥාවෙන් කටයුතු කිරීම තම ලාභ ප්‍රයෝජන නොතකා දේව රාජ්‍යයේ උන්නතිය උදෙසා වැයවීම. (වංචනික ගබඩාකාරකගේ උපමාව) ශු.ලූක් 16:1-9

  - අන් අයගේ ජීවිත වල යහපත උදෙසා තම හැකියාවන් උපරිමයෙන් කැපකිරීම (තලෙන්ත උපමාව) ශු. ලූක් 19:11-27

- ඒ අනුව දේව රාජ්‍යයේ පුරවැසියන්,
  - සුළු දෙයට විශ්වාසවන්ත විය යුතුය.
  - තම කැඳවීමට ප්‍රතිචාර දැක්විය යුතුය.
  - තම හැකියාවන් අන් අය උදෙසා භාවිතා කළ යුතුය.
  - යේසුස් වෙත මුළු හදවතින් කැපවී සේවය කළ යුතුය.
  - දෙවියන් විනිශ්චය නොකළ යුතුය.
  - නිරතුරුවම දේව රාජ්‍යයේ ගෞරවය උදෙසා ක්‍රියා කළ යුතුය.

## 10 වන ශ්‍රේණිය - 24 වන පාඩම
## දේව රාජ්‍යයේ අභියෝග

දේව රාජ්‍යයේ පුරවැසිකම ලැබීම කිතුනු අප ලත් මහත් වරප්‍රසාදයකි. නමුත් ඒ නිසාම අභියෝගවලට මුහුණදීමට සිදුවන බව යේසුස් බොහෝ අවස්ථාවල පැහැදිලි කරදී ඇත. එම අභියෝග තුලින් අප දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ භාරදූරකම අවබෝධ කර ගනිමින් ඊට ප්‍රතිචාර දැක්විය යුතුය.

➢ අභියෝග ජය ගැනීමට නම් අප ;

- කැපවීමෙන් ක්‍රියා කළ යුතුය.
- නිසි සූදානමක් තිබිය යුතුය.
- යේසුස් වහන්සේගේ ඉගැන්වීම් මත පිහිටා සිටි යුතුය.
- ඒ පිළිබඳ යේසුස් වහන්සේ කර ඇති අනතුරු ඇඟවීම් අවබෝධ කරගත යුතුය.

➢ මෙලෙස අප මුහුණ දිය යුතු අභියෝග කිහිපයක් පිළිබඳ අවධානය යොමු කරමු.

**01. අභියෝගය - කැඳවීම ලැබීමේ අභියෝගය**

කැඳවීමේ අභියෝගය දෙයාකාර වේ. (ලූක් 9:57-62)

1. ස්වකැමැත්තෙන් යේසුස් අනුගාමී වීම.
2. යේසුස් වහන්සේගේ ආරාධනයෙන් අනුගාමී වීම.

උදා: චපල ගෝලයන් තිදෙනාගේ කථාව

- අනුගාමීවීමට කැමැත්ත පළ කළ පුද්ගලයා
  යේසුස් වහන්සේගේ ජනප්‍රියත්වය ප්‍රාතිහාර්යයන් ආදී ලෞකික ආකර්ශණය හේතුවෙන් කළ ඉල්ලීම උන්වහන්සේගේ පිළිතුරත් සමග වෙනස් විය.

- අනුගාමීවීමට ආරාධනය ලැබූ දෙවැන්නා
  ලෞකික හේතු නිසා දේව රාජ්‍යයේ කැඳවීම ප්‍රමාද කිරීමට අවසර ඉල්ලීය.

- අනුගාමීවීමට ආරාධනය ලැබූ තෙවැන්නා
  කැඳවීමට කොන්දේසි පැනවීම නිසා ප්‍රතික්ෂේප විය.

**02. අභියෝගය - ප්‍රතිචාර දැක්වීම**

දේව රාජ්‍යයට යේසුස් වහන්සේ ලබාදෙන කැඳවීමට නිසි ප්‍රතිචාර දැක්වීම එහි පුරවැසි පතන සැමගේම වගකීම වේ. එසේ කිරීමේදී අනුගමනය කළ යුතු උපදෙස් මාලාවක් වේ.

- ලෞකික සම්බන්ධතාවලට දක්වන ප්‍රතිචාරවලට වඩා උසස් ප්‍රතිචාරයක් කැඳවීමට දැක්වීම.
- අන් සැමට වඩා උසස් ප්‍රේමයකින් යේසුස් වහන්සේට ප්‍රතිචාර දැක්වීම.
- කුරුසිය දරාගෙන යාමට කැමැති වීම.
- කැඳවීමට ප්‍රතිචාර දැක්වීමේ දී එහි භාරදූරකම වටහා ගැනීම.
- තමා සතු සියල්ල අත්හරිමින් දේව රාජ්‍යයට ප්‍රතිචාර දැක්වීම.

**03. අභියෝගය - නිහතමානීවීම**

නිහතමානීකම තුළින් අදහස් කරන්නේ

- අපගේ පව්කාර ස්වභාවය අවබෝධකර ගැනීම.
- දරුවකු මෙන් කීකරු වීම.
- තමකම ගැනීම.
- දේව කේන්ද්‍රිය ජීවිතයක් ගත කිරීම.

**04. අභියෝගය - ලෞකික වස්තුවට ඇලීම් නොවීමේ අභියෝගය**

සංකීර්ණ වූ සමාජයේ මනුෂ්‍ය අවශ්‍යතා බොහෝ සෙයින් වැඩි වී ඇත. නමුත් දේව රාජ්‍යයේ පුරවැසියන් ඒ ගැන කරදර නොවිය යුතු බව යේසුස් වහන්සේ අවධාරණය කරයි.

උදා:- පොහොසත් මෝඩයාගේ උපමාව
ධනපතියා හා ලාසරුස්

# 10 වන ශ්‍රේණිය - 25 වන පාඩම

## දේව රාජ්‍යය උදෙසා කැපවීම

- දේව රාජ්‍යයේ තීරණාත්මක මොහොත වනුයේ, යේසුස් වහනසේගේ නැවත පැමිණීමයි.

- උන්වහන්සේගේ පැමිණීමට මුහුණදීමට නම්,

  → නිසි සූදානම් පසු විය යුතුය.
  ''ඔබේ ඉඟ පටි බැඳගන්න පහන් ද දල්වා තබාගන්න (ලූක් 12:35-40)

  → විශ්වාසවන්තව නුවණින් ක්‍රියා කළ යුතුය.

  → පසුතැවිලි වීම නිරන්තරයෙන් කළ යුතුය.

  → පටු දොරටුවෙන් ඇතුළුවීමට උත්සාහ කරන්න.

- දේව රාජ්‍යයේ පුරවැසියන් බොහෝදෙනා අනුගමනය නොකළ යුතුය.

- ලෝකයේ පහසු මාර්ග බොහෝ ඇති නමුත් පටු මාර්ගයේ සුළු පිරිසක් ගමන් කරති. නමුත් එහි කෙළවර ජීවනය ඇති බැවින් අප යා යුත්තේ ඒ මාර්ගයේය. ඒ මාර්ගය තෝරා ගන්නෝ සැබවින්ම සදාකාලික ආසිරි ලබන්නේය.

## 10 වන ශ්‍රේණිය - 26 වන පාඩම

## දෙවි වදනින් ආලෝකයක්

- යේසුස් වහන්සේගේ දේව රාජ්‍යයේ ගැඹුරු ගුණධර්ම පොදු ජනතාවට පිළිගැන්වූයේ, ''ඇරමයික් භාෂාවෙනි''

- උන්වහන්සේට සවන් දීමට පැමිණි අයට ඇමතීමට උන්වහන්සේගේ මුහුදු වෙරළ, කඳුමුදුන්, මිටියාවත් තෝරා ගත් සේක.

- උන්වහන්සේ මිටියාවතේ දේශනය තුළ අපට හරවත් මාර්ගෝපදේශයන් රැසක් ලබාදී ඇත.

- යුදෙව්වෝ 'ධනවත්කම' දේවාශිර්වාදයක් ලෙසද, දිළිඳුකම ශාපලත් බවේ ලකුණක් ලෙසද, පිළිගත්හ. නමුත් යේස්සු වහන්සේ දිළිඳුකම ආදර්ශ කොට ගෙන අධ්‍යාත්මික සත්‍යයක් ප්‍රකාශ කළ සේක.

<u>භාග්‍යයන් :</u>

- දිළිඳු වූ ඔබ භාග්‍යවන්තය - උන්වහන්සේ උදෙසා දිළිඳුවීම.
- සාගිනි ඇති ඔබ භාග්‍යවන්තය - ආත්මික කාරණා උදෙසා සාගිනි වීම.
- කඳුළු හෙලන්නෝ භාග්‍යවන්තය.
- දයාවන්නෝ භාග්‍යවන්තය.
- දේවරාජ්‍ය උදෙසා පීඩා විඳින්නේ ආශිර්වාද ලද්දෝය.
- සාමය ඇති කරන්නෝ ආශිර්වාද ලද්දෝය.

<u>අභාග්‍යයන් :</u>

- අහෝ ධනවත්වීම විපතකි.
- පෘෂ්ඨිමත් වූවෝ සාගින්නෙන් පෙළෙනු ඇත.
- සිනාසෙන්නෝ කඳුළු හෙලනු ඇත.

ඒ අනුව කිතුනු දිවිය අප ගත කළ යුත්තේ,

- සතුරන්ට පවා මෙත් වඩමිනි
- යේසුස් වහන්සේගේ ඉගැන්වීම් නැමැති අත්තිවාරම මත දිවිය ගොඩනගමිනි.

සදාතන දිවිය උරුම කර ගැනීමට එවන් ජීවිත ගත කිරීම අවැසිය. එය දේව ප්‍රසන්නතාවයට හේතු වේ.

## 10 වන ශ්‍රේණිය - 27 වන පාඩම

## දෛනික ජීවිතයට මඟ පෙන්වීමක්

- අපගේ ජීවිත දෙවිඳුන් තුළ ගොඩනඟා ගැනීමට මඟ පෙන්වූයේ යේසුස් වහන්සේගේ මුවින් පිට වූ අනර්ඝ වදන්ය. එවදන් අපගේ ශුද්ධ බයිබලය තුළ අඩංගුය.

- දෙව් වදන් අපගේ කිතුනු දිවියට අලෝකයකි. එමෙන්ම අපගේ ජීවිත තුළින් එම ආලෝකය අන් අය වෙත විහිදුවීම අවශ්‍යය. ශුද්ධ බයිබලය තුළින් දිව්‍ය ප්‍රකාශය සහ දේව රාජ්‍යයේ පුරවැසියන් ලෙස රාජ්‍යයේ ආකල්ප අනාවරණය කෙරේ.

- දෙවිඳුන් හා සබඳතාවය ගොඩනඟා ගැනීමට ''යාච්ඤාව'' අප සතු ප්‍රබල අවියකි. උන්වහන්සේ ද තම සේවා කාලයේ දී නොයෙකුත් වර යාච්ඤා කළ සේක.

  - උන්වහන්සේ සිය සේවය ආරම්භ කිරීමට පෙර පුරා දින 40 ක් නිරාහාරය යාච්ඤා කළ සේක.
  - සිය ශ්‍රාවකයන් තෝරා ගැනීමට පෙර මුළු රැයක් පුරා යාච්ඤා කළ සේක.
  - හාස්කම් කිරීමට පෙර යාච්ඤා කළ සේක. (පන්දහසකට කන්න දීම)
  - කුරුසපත් වීමට පෙර දින ගෙත්සෙමෙන උයනේ යාච්ඤා කළ සේක. එම මොහොතේ දීද උන්වහන්සේ පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන ලෙස ශ්‍රාවකයන්ට උපදෙස් දුන් සේක.

- ගෝලයන් විසින් ''යාච්ඤා කිරීමට උගන්වන ලෙස කරන ලද ඉල්ලීමට'' අනුව ස්වාමීන්ගේ යැදුම උගන්වන ලදි.

- උන්වහන්සේගේ අනුගාමිකයෙකු ලෙස අපගේ ජීවිත තුළ තිබිය යුතු සුවිශේෂී කාරණා :

  - අපගේ ජීවිත ආලෝකමත් කර ගන්නා අතරම යේසුස් අයට ද අලෝකයක් වීම.
  - පෞද්ගලික අවශ්‍යතා ගැන කරදර වීම නිෂ්ඵල බව.
  - ආගන්තුක සත්කාරය.
  - පොළොවේ ලුණු මෙන් වීම
  - ශුද්ධාවත් ජීවිතයක් ගත වීම.
  - සියල්ලෙහිද ස්තුතිවන්ත භාවය
  - දෙවිඳුන්ගේ කොටස පිදීම

- ස්වාමීන්ගේ යැදුම ලියා දක්වන්න. කට පාඩම් කරන්න.